වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

# ජල සම්පත් මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

# 2011

A/251/2010

ගරු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය,
නීතීඥ, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය,
අංක 500, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

**<u>2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා<br>ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.</u>**

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්යයන් ඉටු කිරීම පිළිබඳ වූ වාර්තාව 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 19 (1) ඡේදය අනුව මේ සමඟ ඉදිරිපත් කරමි.

එම පනතේ 19 (2) ඡේදය අනුව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල වූ මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ විගණකාධිපති වාර්තාව හා අදාල වර්ෂයේ ගිණුම් ප්‍රකාශන ද මේ සමඟ ඉදිරිපත් කරමි.

ස්තූතියි.

මෙයට - විශ්වාසි වූ

අත්:කලේ: බන්ධුල මුණසිංහ
සභාපති
ජල සම්පත් මණ්ඩලය.

# වාර්ෂික වාර්තාව - 2011
## ජල සම්පත් මණ්ඩලය

### 1. හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණය හා ඵලදායි අයුරින් උපයෝගි කරගැනීම ආදි සියළු කරුණු පිළිබඳව විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් ප්‍රසාරණය වී ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන් හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාල කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සංශෝධනය කරන ලදි. .

### 2. දැක්ම

පිරිසිදු සහ ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම ජල සම්පත් මණ්ඩලයේ දැක්ම වේ.

### 3. මෙහෙවර

ග්‍රාමීය ජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු / අධිකාරි /ආයතන / ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සහ දේශීය මෙන්ම විදේශීය විද්‍යාඥයින් ආදිය සමග සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූ ගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට ලබාදීම ජල සම්පත් මණ්ඩලයේ මෙහෙවර වේ.

### 4. අරමුණු

(අ) භූගත ජල සම්පත් තක්සේරු කිරීම සහ සංවර්ධනය සඳහා වූ පර්යේෂණ සිදු කිරීම.

(ආ) භූ ගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම.

(ඇ) භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම.

(ඈ) භූ ගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඉ) භූ ගත ජල සම්පත් ව්‍යාපෘති ඇගයීම.

(ඊ) වෙනත් ආයතන හා සම්බන්ධ වී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

### 5. කාර්යයන්

(අ) ශ්‍රී ලංකාවේ ජල සම්පත් පිළිබඳව පර්යේෂණ කිරීම.

(ආ) භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා පවතින දත්තයන් හි භූ විද්‍යාත්මක අදහස් දැක්වීම .

(ඇ) භූ ගත ජල සම්පත් සොයාගැනීම පිණිස භූ සමීක්ෂණ සිදු කිරීම.

(ඈ) භූ ගත ජල විභවයන් පවතින ස්ථාන හඳුනාගැනීම.

(ඉ) භූගත ජල මූලාශ්‍ර පවතින ස්ථාන විද්‍යාත්මක ලෙස නිර්ණය කිරීම.

(ඊ) භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.

(උ) රසායනික හා භෞතික ලක්ෂණ හඳුනාගැනීම සඳහා මෙන්ම ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ සඳහා ද ජල නියැඳියන් විශ්ලේෂණය කිරීම.

(ඌ) භූ ජල දත්ත එක්රැස් කිරීම භූගත ජල දත්ත රැස්කර පවත්වාගෙන යාම සහ භූජල සිතියම් පිළියෙල කිරීම.

## 6. අධ්‍යක්‍ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. | බන්දුල මුණසිංහ මහතා | සභාපති |
| 2. | වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා | ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ |
| 3. | එම්. ඒ, පී. හේමචන්ද්‍ර මහතා | අධ්‍යක්‍ෂ |
| 4. | නීතීඥ ආර්.බී. සී. රත්නමලල මහතා | අධ්‍යක්‍ෂ |
| 5. | ආර්. එම්. සී. රත්නායක මහතා | අධ්‍යක්‍ෂ |
| 6. | නීතීඥ ශ්‍රියානි පෙරේරා මිය | අධ්‍යක්‍ෂ |
| 7. | අසංග දයාරත්න මහතා | මහ භාණ්ඩාගාරයේ නියෝජිත |

## 6 . 1 අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් හතක් (07) පැවැත්වීමට කටයුතු කරන ලදි.

## 6 . 2 විගණන හා කළමනාකරණ කමිටුව

| | | | |
|---|---|---|---|
| 1. | ආර්.බී. සී. රත්නමලල මහතා | සභාපති | අධ්‍යක්‍ෂ |
| 2. | වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා සාමාජික | ක්‍රියාකාරී | අධ්‍යක්‍ෂ |
| 3. | එම්. ඒ, පී. හේමචන්ද්‍ර මහතා | සාමාජික | අධ්‍යක්‍ෂ |
| 4. | ආර්. එස්. විජේසේකර මහතා | ලේකම් | සාමාන්‍යාධිකාරී |
| 5. | අසංග දයාරත්න මහතා | සාමාජික | (මහ භාණ්ඩාගාරයේ නියෝජිත) |

### 6.2.1 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහක් (05) පැවැත්වීමට කටයුතු කරන ලද අතර අමාත්‍යංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනකට ද (03) ජල සම්පත් මණ්ඩලය සහභාගි වන ලදි..

## 6 . 3 ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් - 2011 වර්ෂය

| | | | |
|---|---|---|---|
| 1. | ආර්. එස්. විජේසේකර මහතා | - සාමාන්‍යාධිකාරී | |
| 2. | ජේ. වීරකෝන් මහතා | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භූජල) | |
| 3. | ඒ. බී. එම්. චන්ද්‍රසිරි මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | |
| 4. | එම්. ඒ. පුෂ්පකුමාර මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (පාලන) | |
| 5. | නිහාල් වෙල්ලාලගේ මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (විදුම්) | |
| 6. | පී.ආර්.ආර්.කරුණාරත්න මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (භූජල) | 2011.12.01 දින සිට |
| 7. | පී.පී.ආර්.එස්.කේ.පතිරණ මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) | 2011.12.01 දින සිට |
| 8. | එම්.ජේ.දේශප්‍රිය මහතා | - සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) | 2011.12.01 දින සිට |

## 7 2011 වසර තුළ ඉටුකරන ලද මෙහෙයුම් කාර්යයන් :

සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන යටතේ පහත සඳහන් පර්යේෂණ මට්ටමේ අධ්‍යනයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

## 7.1. කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත ජල ධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය

### හැඳින්වීම

කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් හි වෙරළාශ්‍රිත කළාපයට අයත් සම්පිණ්ඩිත නොවන වැලි හා මැටි මිශ්‍රිත වැලි ධරයේ භූ ජල විද්‍යාත්මක අධයනය හා මෙම ප්‍රදේශයේ නොගැඹුරු ජල ස්ථරයේ සැකසීම හඳුනාගැනීම. මෙම ප්‍රදේශයේ භූගත ජල අධ්‍යයනයන් සිදු කිරීම සඳහා තෝරාගැනීමට හේතුවූ කාරණා කිහිපයක් වන්නේ

1. විවිධ සංවිධානයන් හා පුද්ගලික පාර්ශ්වයන් සැලකිය යුතු තරමේ වූ ජල ප්‍රමාණයක් උකහාගැනීම. (BOI, Airport, Katunayake, Hotels etc)
2. ජනගහනයෙන් 50% කට වඩා නොගැඹුරු වළ ළිං හා නල ළිං මත රඳාපැවතීම.
3. මෙම ප්‍රදේශය බොහෝ සේ නාගරීකරණය හා කාර්මිකකරණය වීම

### ව්‍යාපෘතියේ අරමුණු:

ජල ධරය සංරක්ෂණය කිරීම

### විශේෂ අරමුණු:

1. ජල ස්ථරයේ ජ්‍යාමිතික පිහිටීම, භූ ජල විභවය හා ජලයේ ගුණාත්මකතාවය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු එකතු කිරීම.
2. ජල ධරය නැවත ආරෝපණය කල හැකි ස්ථාන හඳුනා ගැනීම
3. දීර්ඝ කාලීන නිමාන කටයුතු කිරීම සඳහා ජල නිමාන පද්ධතියක් ඇති කිරීම
4. ක්‍රමවත් නිමාන ක්‍රමවේදයක් තුලින් ජල ධරයේ මාන කළමනාකරණය ඇති කිරීම

### ක්‍රමවේදය

1. දැනට පවතින දත්ත සමාලෝචනය හා දත්තවල පවතින අඩුපාඩු හඳුනා ගැනීම
2. මූලික සිතියම් පිළියෙල කිරීම්
3. ජලයේ දැනට පවතින ගුණාත්මකතාව හඳුනාගැනීම සඳහා ජල සාම්පල එකතුකිරීම හා රසායනිකව විශ්ලේෂණය කිරීම
4. භූ භෞතික විද්‍යා සමීක්ෂණ සිදු කිරීම හා පරීක්ෂණ නල ලිං සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම
5. පරීක්ෂණ නල ලිං ඉදිකිරීම
6. පොම්ප පරීක්ෂණ සිදු කිරීම හා ලිංවල මට්ටම් මැනීම
7. දිගු කාලීන මැනුම් කටයුතු සඳහා ජල නිමාන පද්ධතියක් ස්ථාපිත කිරීම

## 7. 2. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජලයේ ගුණාත්මකතාවයේ වෙනස්වීම පිළිබඳ අධ්‍යනය

### අධ්‍යයනයේ අරමුණ

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ මතුපිට ජලයේ ද නොගැඹරු හා භූ ගත ජල සම්පත් වල ද ගුණාත්වයේ වෙනස්වීම් හඳුනාගැනීම වේ.

### අධ්‍යයන ප්‍රදේශය

මෙම අධ්‍යනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ද්‍රෝණි 05ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

- මෝදරගම් ආරු
- කලාඔය
- මල්වතු ඔය
- මා ඔය
- යාන් ඔය

## 7. 3. සමස්ථානික භාවිතයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ භූගත ජලයේ ගුණාත්මකතා අධ්‍යනය

## 7.4. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආධාර ඇතිව මන්නාරම් දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කරන ලද ජනතාව සඳහා වූ අත්පොම්ප නල ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2011 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලය මගින් භූජල සමීක්ෂණ එකසිය අනූහයක් (196), නල ළිං එකසිය තුනක් (103) හා පරීක්ෂණ නල ළිං විසිහතරක් (24) සාර්ථකව ඉදිකරන ලදි. ඊට අමතරව ඉදි කරන ලද නල ළිං පනස් හතක් (57) සඳහා ජල ධාරිතා පරීක්ෂණ සිදු කරන ලදි. නල ළිං හැත්තෑ එකක් (71) සඳහා අත්පොම්ප සවි කිරීම් හා නල ළිං පහක් (05) සඳහා ගැඹුරු ජල පොම්ප සවිකිරීම් කටයුතු සිදු කරන ලද.. ඉදිකරන ලද නල ළිං පණස් හතක් (57) නැවත පිරිසිදු කිරීමේ කටයුතු ද දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් එකතු කරගන්නා ජල නියැදි හාරදහස් එකසිය පනස් තුනක (4153) විශ්ලේෂණය කිරීමේ කටයුතු ද 2011 වසර තුළදි සිදු කරන ලදී.

ඉහත මෙහෙයුම් කාර්යයන් පලාත් හා අංශයන් අනුව විස්තරාත්මක වශයෙන් පහත දැක්වේ.

## 8. උතුරු පළාත

## 8 . 1 ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආධාර (JICA) මගින් මන්නාරම් දිස්ත්‍රික්කයේ නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතිය (MANREP)

### ව්‍යපෘතියේ අරමුණ :

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ නැවත පදිංචිකිරීම් කරනු ලබන ප්‍රජාව වෙත පිරිසිදු පානීය ජලය සැපයීම හා අනෙකුත් ගෘහස්ත අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය ජල යෝජනා ක්‍රම ඇති කිරීමයි.

### ව්‍යාපෘතියේ පිහිටීම :

මෙම ව්‍යාපෘතිය මන්නාරම් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතර (04) ක ක්‍රියාත්මක විය. (විස්තර පහත වගුවෙන් දැක්වේ.)

| ප්‍රාදේශී ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම | ගමේ නම | ඉටුකරන ලද කාර්යයන් |
|---|---|---|---|
| මන්නාරම නගරය | පරපන්කන්ඩල් | සිරිකුලම් | නල ළිඳක් ඉදිකිරීම ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම හා විදුලි ජනනයන්ත්‍රයක් හා පොම්පයක් සවිකිරීම |
| නානට්ටාන් | වෙඩ්ඩියර්මාගන් කඩ්ඩෙයිඅඩම්පන් | වෙඩ්ඩියර්මාගන් කඩ්ඩෙයිඅඩම්පන් | නල ළිඳක් ඉදිකිරීම ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම හා පොම්පයක් සවිකිරීම |
| මන්තායි බටහිර | වෙල්ලන්කුලම් | සේවා විලෙප් | විදුලි ජනනයන්ත්‍ර දෙකක් හා පොම්ප දෙකක් සවිකිරීම |
| | | ගනේෂපුරම් | විදුලි ජනනයන්ත්‍ර දෙකක් හා පොම්ප දෙකක් සවිකිරීම |
| | පලිආරු | පලිආරු | නල ළිඳක් පිරිසිදුකිරීම ප්‍රතිසංස්කරණය ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම අත් පොම්පයක් සවිකිරීම |
| මඩු | විලතිකුලම් | විලතිකුලම් | නල ළිඳක් ඉදිකිරීම ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම හා විදුලි ජනනයන්ත්‍රයක් හා පොම්පයක් සවිකිරීම |
| | පරසන්කුලම් | පරසන්කුලම් | නල ළිඳක් ඉදිකිරීම ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම හා විදුලි ජනනයන්ත්‍රයක් හා පොම්පයක් සවිකිරීම |
| | | සින්න වලයන්කඩ්ඩු | නල ළිඳක් ඉදිකිරීම ජලයේ ගුණාත්මකතාවය පරීක්ෂාකිරීම හා විදුලි ජනනයන්ත්‍රයක් හා පොම්පයක් සවිකිරීම |

මෙම ව්‍යාපෘතිය යටතේ නල ළිං නමය (09) ක් , ජල ධාරිතා පරීක්ෂණ හයක් (06), ජලයේ ගුණාත්මකතා පරීක්ෂාකිරීම් හයක් (06),අත් පොම්ප සවිකිරීම තුනක්(03), සබ්මර්සිබල් පොම්ප සවිකිරීම් නමයක් (09),විදුලි ජනනයන්ත්‍ර සවිකිරීම් අටක්(08) හා විදුලි රැහැන් සම්බන්ධතා එකක්(01) සිදු කරන ලදී. ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 24.207 කි.

## 8 . 2 යුනිසෙෆ් ව්‍යාපෘතිය - මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල

මෙම දිස්ත්‍රික්ක වල පිහිටි සෞඛ්‍ය මධ්‍යස්ථාන හා රෝහල් සඳහා නිෂ්පාදිත නල ළිං පහ (05) ක් ඉදිකරන ලද අතර  පාසැල් සඳහා අත්පොම්ප නල ළිං හය (06) ක් ඉදිකර අත් පොම්ප හය (06)ක් සවිකරන ලදී. මුළු ව්‍යාපෘති වටිනාකම රුපියල් මිලියන තුනයි දශම හතරකී (රු. මි. 3.48).

## 9. බස්නාහිර පළාත

2011 වසරේදී බස්නාහිර පළාත තුළ පහත සඳහන් කාර්යයන් නිම කරන ලදී. භූජල සමීක්ෂණ තිස්හයක් (36) හා නල ළිං ඉදිකිරීම් එකොළහක් (11) නිම කරන ලදී. ජල ධාරිතා පරීක්ෂණ හතක් (07) හා නල ළිං පිරිසිදුකිරීම් පනස්එකක් ද (51) සිදු කරන ලද.. ජලයේ රසායනික විශ්ලේෂණයන් එකසිය අනූඑකක් (191) හා ක්‍ෂුද්‍ර ජීවී පරීක්ෂණ අනූඑකක් (91) ද සිදුකරන ලදී. සබ්මර්සිබල්  පොම්ප තුනක් (03) සවි කිරීම් නිම කරන ලදී. වසරේදී උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන එකොළහ හමාරක් (11.5)ක් වේ.

## 10 උතුරු මැද පළාත

අනුරාධපුර කොරකහවැව පිහිටි පලාත් කාර්යාලය මගින් කිලිනොච්චි, අනුරාධපුර, මහනුවර දිස්ත්‍රික්ක තුල සිදුකල භූ-ජල සමීක්ෂණ සඳහා රු. 663,800.00 ආදායමක් ලබා ඇති අතර, අනුරාධපුර හා මහනුවර දිස්ත්‍රික්ක තුල ඉදිකල නිෂ්පාදිත නල ලිං මගින් රු. 4,946,812.80ක ආදායමක් 2011 වර්ෂය සඳහා ලබා ඇත. එසේම පොම්ප පරීක්ෂණ හා පොම්ප සවි කිරීම මගින් රුපියල් 675,480.00 ක ආදායමක් ලබා ඇත. කොරකහවැව පලාත් කාර්යාලයට අනුබද්ධව පවතින රසායනාගාරය මගින් විවිධ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ජලය රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂණ මගින් රු. 474,716.19 ක මුදලක් ලබා ඇත. එසේම කාර්යාලයට අනුබද්ධ සංචාරක බංගලාවේ වාර්ෂික ආදායම රු. 129,784.00 වේ..

## 10. 1 ජල උල්පත් අධ්‍යනය හා සංරක්ෂණය

මෙම වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ජල උල්පත් 35 ක් අධ්‍යනය සඳහා තෝරාගෙන ඇති අතර, එම ජල උල්පත් කැබිතිගොල්ලෑව, පලාගල, පලුගස්වැව, හොරොව්පතාන,ගලෙන්බිඳුනුවැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පිහිටා ඇත.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පිහිටි ජල උල්පත් වල පවතින ජලයේ ගුණාත්මකභාවය සෙවීම සඳහා රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂාවන් මාසිකව සිදු කරන ලද අතර එහි ප්‍රතිඵල මත ජල උල්පත් සංරක්ෂණය සඳහා සුදුසු ස්ථාන තෝරා ගන්නා ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය වර්ධනය කිරීම අරමුණ ඇතිව පිරිසිදු පානීය ජලය මෙම උල්පත් මගින් ලබා ගැනීමට අවශ්‍ය පරිදි සකස් කර දී ඇත. එම ස්ථාන පහත දැක්වේ.

වගුව 03: සංරක්ෂණය කරන ලද ජල උල්පත්

| අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය | ජල උල්පතේ නම | ප්‍රතිලාභ ලබන පවුල් ගණන (දළ වශයෙන්) |
|---|---|---|---|
| 01 | පලාගල | තෙලදින්නන්වැව | 20 |
| 02 | ගලෙන්බිඳුනුවැව | ගැරඩියා උල්පත | 100 |




සංවර්ධනය කරන ලද ජල උල්පතක්

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය ලබා දී ඇත

## 10 . 2 පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - කොරකහවැව

### (අ) ජලය ආශ්‍රිත රෝග අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ තුන්දින නේවාසික වැඩමුළුව

### 1. 1 ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන

උතුරුමැද පළාතේ ව්‍යාප්ත වෙමින් පවතින වකුගඩු රෝගය හා ජලය ආශ්‍රිත වෙනත් රෝග අවම කිරීමේ හා පාලනය කිරීමේ අරමුණින් ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් එම ප්‍රදේශ වල ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇත. ග්‍රාමීය ජනතාව ඉලක්ක කරගත් මෙම වැඩ සටහන් අදියර දෙකකින් ක්‍රියාත්මක වන අතර 2011 වසර සඳහා වූ මුල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත.

මෙම වැඩසටහන සඳහා වකුගඩු රෝග බහුලව පවතින ප්‍රදේශ වල ග්‍රාමීය ජනතාව සමග නිතර සම්බන්ධකම් පවත්වන රාජ්‍ය නිලධාරීන් වන මහජන සෞඛ්‍ය පරීක්ෂක,පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීනියන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන්, ගුරු මහත්ම මහත්මීන්, කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් හා විශ්වවිද්‍යාල සිසු සිසුවියන් සහභාගී කරගෙන ඇත. මෙම වැඩසටහන තුන්දින නේවාසික වැඩමුළුවක් වන අතර, පාඨමාලාවට අදාල මුද්‍රිත නිබන්ධන, නේවාසික පහසුකම් හා ආහාරපාන පාඨමාලා ලාභීන් සඳහා නොමිලේ සපයනු ලැබේ. එසේම පාඨමාලා ලාභීන් සඳහා සහතික පත්‍රයක්ද ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් පිරිනමනු ලැබේ.

#### සහභාගීවූ පාඨමාලා ලාභීන්

2011 ජනවාරි මස සිට දෙසැම්බර් මස වන විට මෙම වැඩමුළු දහයක් (10) පවත්වා ඇති අතර, අනුරාධපුර,පොළොන්නරුව හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්ගෙන් පැමිණි නිලධාරී මහත්ම මහත්මීන් දෙසිය තුන් (203) දෙනෙකු සහභාගී වී ඇත. සහභාගී වූ පාඨමාලා ලාභීන් පහත සඳහන් පරිදි වේ.

| තනතුර | දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව | කුරුණෑගල |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක, | 05 | 04 | - |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 15 | 02 | - |
| සමෘද්ධි සංවර්ධන නිලධාරීන් | 20 | 02 | 06 |
| ග්‍රාම නිලධාරීන් | 35 | 06 | 07 |
| උපගුරු | 34 | - | - |
| කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් | - | 30 | - |
| ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් | 37 | - | - |



වැඩමුළුව සඳහා සහභාගී වූ පාඨමාලා ලාභීන්.

**පාඨමාලා අන්තර්ගතය**

මෙහි දේශන පැවැත්වීම සඳහා ජලය ආශ්‍රිත විශේෂඥ දැනුමක් ඇති විද්‍යාඥයන්, වෛද්‍යවරුන් හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශේෂඥ මහතුනගේ සහය ලබාගත් අතර, පාඨමාලා අන්තර්ගතය සඳහා පහත දක්වා ඇති පරිදි ජලය සම්බන්ධව විවිධ ක්ෂේත්‍ර ඇතුලත් කර ඇත

01 ශ්‍රී ලංකාවේ ජල සම්පත් හඳුන්වා දීම (භූගත ජලය හා භූතල ජලය ඇතුළුව) ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකභාවය, ජල විශ්ලේෂණය හා පානීය ජලයේ ප්‍රමිතීන්

02 ජල කළමනාකරණය, සංරක්ෂණය හා පාරිසරික ගැටලු, භූ ජල සමීක්ෂණ ක්‍රම, ජල දූෂණය

03 ජලය ආශ්‍රිත රෝග, රෝග හේතු කාරක හා රෝග නිවාරණය

04 ජලය පිරිසිදු කිරීමේ ක්‍රම, ජල පෙරණ හඳුන්වා දීම.

## 1. 3 ජල සායනය

සෞඛ්‍ය බලධාරීන්ගෙන් හා පාඨමාලා ලාභීන්ගෙන් ලබා ගත් තොරතුරු අනුව වකුගඩු රෝගය හා ජලය ආශ්‍රිත වෙනත් රෝග බහුලව පවතින ප්‍රදේශ හඳුනාගැනීමෙන් අනතුරුව එම ප්‍රදේශ වල ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ ජල සායන වැඩසටහන මගින් සිදු කෙරේ. මෙම වැඩසටහන්, ප්‍රථම අදියරේ වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරි මහත්ම මහත්මීන්ගේ සංවිධායකත්වයෙන් හා ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය හා එම ප්‍රදේශ වල රාජ්‍ය නිලධාරීන්ගේ (ප්‍රාදේශීය ලේකම්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී) සහභාගීත්වයෙන් පැවැත්වේ. මෙම වැඩසටහන යටතේ 2011 ජනවාරි මස සිට දෙසැම්බර් මස වන විට ජල සායන විස්සක් (20) ක්‍රියාත්මක කර ඇත.

මෙම ජල සායන වලදී සරල පත්‍රිකා බෙදා දීම,දේශණ හා සාකච්ඡා ඇසුරින් දැනුවත් කිරීම ජල විශ්ලේෂණය, ෆ්ලෝරයිඩ් පෙරණ හඳුන්වා දීම හා මැටි වළං කට්ටල බෙදා දීම යන ක්‍රියාකාරකම් මගින් ප්‍රජාව දැනුවත් කිරීම ජල සම්පත් පර්යේෂණ හා පුහුණු ආයතනයේ අරමුණ වේ. මේ යටතේ සිදුකල සේවාවන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පැවැත් වූ ජල සායන ගණන | : | 20 |
| ජල සායන සඳහා සහභාගී වූ ගණන | : | 2846 |
| විශ්ලේෂණය කරන ලද ජල නියැදි ගණන | : | 2077 |
| බෙදාදුන් ජල පෙරණ ගණන | : | 248 |
| බෙදාදුන් මැටි වළං කට්ටළ ගණන | : | 298 |



**ජල සායන වැඩසටහනක දී**

## 11. වයඹ පළාත

වයඹ පළාත් ජනතාවගේ ගෘහස්ථ කෘෂිකාර්මික හා කර්මාන්ත අවශ්‍යතා සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ජල අවශ්‍යතා සපුරාලීමට සමාලෝචිත වර්ෂය තුළදී භූජල සමීක්ෂණ පනස්තුනක් (53) හා නල ළිං හතලිස්තුනක් (43) විදුම් කටයුතු සිදු කර අත්පොම්ප සවිකරන ලද. නල ළිං දහනමයක (19) ජල ධාරිතා පරීක්ෂණ මෙහෙයවන ලද අතර නල ළිං එකක් (01) පිරිසිදු කිරීමේ කාර්යය ද ජල නියැදි විශ්ලේෂණ දෙසිය හතලිස් හතරක් (244) පරීක්ෂා කිරීම ද සිදු කරන ලදී උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන විසිදෙකකි. (22)

2011 වර්ෂය තුළදි පුත්තලම පළාත් කර්යාලය මගින් සිදුකරන ලද භූ ගත ජල සම්පත් තක්සේරු, ගවේෂණ හා සංවර්ධනය කිරීමේ කටයුතු පහත පරිදි වේ.

1. රාජ්‍ය ආයතන විසින් ග්‍රාමීය ප්‍රදේශ වල ක්‍රියාත්මකව ඇති ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා දන්ගහවල, වල්පාලුවල, බත්තුලුඔය, ආරච්චිකට්ටුව හා පුත්තලම යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල භූ ජල සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීම හා අත්පොම්ප සවිකිරීම්. (ආදායම් මුදල රු. 1,661,214.00 කී.)
2. කෘෂිකර්ම කටයුතු වලට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා මහකුඹුක්කඩවල, පුත්තලම, වනාතවිල්ලුව, මුන්දලම යන ප්‍රදේශවල භූ ජල සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම හා ජල ධාරිතා පරීක්ෂණ සිදු කරන ලදී.. (ආදායම් මුදල රු. 2,364,902.40 කී.)
3. වර්ල්ඩ් විෂන් ආයතනය හා එක්ව වනාතවිල්ලුව හා කල්පිටිය යන ප්‍රදේශ වල ග්‍රාමීය ජනතාවගේ පානීය ජලයෙහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ජල සාම්පල එක්රැස් කිරීම හා එම ජල සාම්පල් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම. ආදායම් මුදල රු.701 ,120.00 කී.
4. හොල්සිම් ලංකා ආයතනය විසින් අරුවක්කාරු හුණු ගල් අවසාදිතයෙහි කැනීම් කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා ජල මට්ටමට වඩා පහළින් කැනීම් කටයුතු සිදු කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද භූ ජල ගවේෂණ කටයුතු වෙනුවෙන් එම හුණු ගල් අවසාදිතයෙහි නල ළිං ඉදිකිරීම හා ජල ධරයන්හි පාරගම්‍යතාවය අධ්‍යනය සඳහා පැය 72 ජල ධාරිතා පරීක්ෂණ කිරීම, ජල සාම්පල් විශ්ලේෂණය සිදු කිරීම හා අදාල වාර්තා සකස් කිරීම. - ආදායම් මුදල රු.9,510,951.56 කි.
5. මන්නාරම් ප්‍රදේශයේ නැවත පදිංචි වන ජනතාවගේ පානීය හා අනෙකුත් ජල පහසුකම් සැපයිම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) ආධාර යටතේ අත් පොම්ප නල ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව සිදු කිරීම. - ආදායම් මුදල රු.158,480.00 කි.
6. මන්නාරම පණ්ඩරවේලි ප්‍රදේශයේ පානීය ජල බෝතල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ජල ප්‍රභය හඳුනා ගැනිම සඳහා අවශ්‍ය භූ ජල ගවේෂණ සිදු කර අදාල නිර්දේශ ලබාදිමට කටයුතු කිරීම. - ආදායම් මුදල රු. 124,656.00 කි.

7. නාත්තන්ඩිය යොවුන් සේනාංකය මධ්‍යස්ථානයේ ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා භූ ජල සමීක්ෂණ සිදු කර වල ළිඳක් ඉදිකිරීම සඳහා ස්ථානයක් තෝරා දීම හා පවතින නල ළිඳ පිරිසිදු කර දීම. ආදායම් මුදල රු 85,680.00 කි.

8. පුත්තලම ප්‍රදේශයේ ජල සම්පාදන කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් නල ලිං වල ජලය භාවිතා කරන අතර මෑත කාලයේදී ජල ඉල්ලුම වැඩිවීම නිසා නල ළිං මගින් ජලය ලබා ගැනීමේ ප්‍රවනතාවය සීඝ්‍රයෙන් වර්ධනය විය. මෙසේ භූගත ජලය අධිකව ලබා ගැනීම නිසා මුහුදු ජලය ගැඹුරු අවසාධිත පාෂාණයන්හි ඇති ජල ප්‍රභව තුලට ඇතුල්වීමේ හැකියාව පවතී. එම නිසා මෙම තත්වය පරීක්ෂා කිරීම සඳහා සමස්ථානික (Isotope) භාවිතා කර පර්යේෂණ පරමාණු ශක්ති අධිකාරියේ සහය ඇතිව සිදු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස මුහුදු ජලය ගැඹුරු නල ළිං ආශ්‍රිත ජල ධර වෙත ඇතුල් නොවන බව සොයා ගන්නා ලදී. ආදායම් මුදල රු. 594,033.74 කි.

9. වයඹ පළාතෙහි සිදු කරනු ලබන කර්මාන්ත හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය පාරිසරික වාර්තා නිර්දේශ ලබා දිම සඳහා භූ ජල සමීක්ෂණ, පොම්ප පරීක්ෂණ හා ජල රසායනික විශ්ලේෂණ සිදු කර එම වාර්තා වයඹ පළාත් අධිකාරිය වෙත ලබාදිම. මේ යටතේ මාර්ග ඉදිකිරීම් වලට අදාල කළුගල් ලබා ගැනිමේ ව්‍යාපෘති, රෙදි සේදීමේ කර්මාන්ත ආශ්‍රිතව සිදු වන ජලය බැහැර කිරීම හා කර්මාන්ත ආශ්‍රිතව ජලය ලබා ගැනීම ආදිය පරික්ෂා කර අදාල වාර්තා ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. ආදායම් මුදල රු. 56,560.00 කි.

10. වෙිලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ කල්පිටිය, පුත්තලම හා වනාතවිල්ලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, භූ ජල පර්යේෂණ කටයුතු සඳහා තෝරා ගෙන ඇත. ඒ යටතේ එම ප්‍රදේශයන්හි ඉදිකරන සියලු නල ළිං වල දත්ත රැස් කිරීම, ජලයෙහි ගුණාත්මක භාවය වෙනස් වීම පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සඳහා ජල නිමාන (Well Monitoring) සැලැස්මක් සකස් කිරීමටද ප්‍රදේශයේ භූගත ජලය විශ්ලේෂණය කර සිතියම් සකස් කිරීමද, වනාතවිල්ලුව ප්‍රදේශයේ ජල ධරයන්හි ස්වභාවය හඳුනා ගැනීම සඳහා එම ප්‍රදේශයේ පර්යේෂණ නල ළිඳක් ඉදිකිරීම ද සිදුකරන ලදී..- ආදායම් මුදල රු 161,414.01 කි.

11. පුත්තලම පළාත් කාර්යාලයේ රසායනාගාරය වෙිළි ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ අංග සම්පූර්ණ විද්‍යාගාරයක් බවට පරිවර්තනය විය. එමගින් මෙම පළාතෙහි ජනතාවගේ පානීය ජලයෙහි ගුණාත්මකතාව පරික්ෂා කර ගැනිමට මහෝපකාරී වන අතර ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ කටයුතු සිදුකර ගැනීම ඉතා පහසු වේ.

12. පශු සම්පත් ආයතනය සතු වනාතවිල්ලුවෙහි පිහිටි මාටින් ගොවිපලෙහි ජලය ලබා ගැනිම නල ලිඳක් ඉදිකිරීම සඳහා භූ සමීක්ෂණ සිදුකිරීම. - අදායම් මුදල රු.40,320 කි.

13. අළුතින් නිවසනයක් ඉදිකිරීම ආරම්භ කරන ලදී.

## 12. දකුණු පළාත

දැනට හම්බන්තොට පිහිටි දකුණු පළාත් කාර්යාලය මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

1. තංගල්ල ධීවර වරායේ නල ලිඳ සඳහා ජල ධාරිතා පරීක්ෂණයක් කිරීම සහ වාර්ථා සැපයීම.
2. තිස්සමහරාම ලේක් සයිඩ් ටුවරිස්ට් ඉන් සඳහා භූ ජල සමීක්ෂණ සිදුකර වාර්ථා සැපයිම.
3. හම්බන්තොට පරමාණු බල ශක්ති අධිකාරිය සඳහා නල ළිඳක් ඉදි කිරීම .
4. දික්කුඹුර, අඳුන්ගොඩ පිහිටි ජේ.ඊ.ඩී. ජීවන්ත මහතාට අයත් ගල් වල මගින් භූ ගත ජල සම්පත කෙරෙහි සිදුවිය හැකි හානි පරීක්ෂා කර භූ ජල සමීක්ෂණ වාර්ථාවක් ලබාදීම.
5. 153 සී, කබරගල පිහිටි ජ..එම්.කේ. සුමනරත්න මහතාට අයත් ගල් වල මගින් භූ ගත ජල සම්පත කෙරෙහි සිදුවිය හැකි හානි පිළිබඳ පරීක්ෂා කර භූ ජල සමීක්ෂණ වාර්ථාවක් සැපයීම.
6. මුතියංගන රජ මහා විහාරයට අධි ධාරිතාවයකින් යුත් නල ළිඳක් ඉදිකර දෙන ලද අතර, ඒ සඳහා ජල සැපයුම ද කරන ලදී.

## 13. ඌව පළාත

1. මොණරාගල දිස්ත්‍රික්කය තුල පැවති දැඩි නියඟ තත්වයට මහුණ දීම සඳහා නල ළිං ඉදි කල අතර ප්‍රදේශයේ පිහිටි වැඩි ධාරිතාවයකින් යුත් ළිං වලට පොම්ප සවිකරන ලද.. මේ සමයේ උග්‍ර ජල හිගයකට මුහුණ පා සිටි මොණරාගල රෝහල වෙත ජල සම්පත් මණ්ඩලය මගින් ඉදිකරන ලද නල ළිඳෙන් වතුර පොම්ප කර ජල ප්‍රශ්ණය විසඳන ලදී. මෙයට අමතරව ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා අපගේ තාක්‍ෂණය උපයෝගි කර ජල පෙරන සවිකර දෙන ලදී.

2. ඌව පළාත් සභා ප්‍රතිපාදන යටතේ බණ්ඩාරවෙල දෙමළ මහා විද්‍යාලය, බණ්ඩාරවෙල වඩු පාසැල, නෙල්ලියද්ද ගම්මානය යන ස්ථාන වල සාර්ථකව නල ළිං ඉදිකරන ලද අතර , වඩු පාසැල භූමියේ පිහිටි නල ළිඳෙහි ජල ධාරිතාව පරීක්‍ෂා කරන ලදි. මේ සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දුන් ප්‍රතිපාදන මුදල රු. **1,650,890.00.** කි.

3. 2011 පෙබරවාරි 04 දා සිට බුත්තල පැවැත්වූ දැයට කිරුළ වැඩ සටහන වෙනුවෙන් ප්‍රදර්ශන කුටි ඉදිකිරීම සිදුකරන ලදී.. මේ වෙනුවෙන් රු. 300,000.00 මුදලක් අමාත්‍යාංශයෙන් ලබා දෙන ලදී.

4. බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින පානීය ජල අවශ්‍යතාවය වෙනුවෙන් ගරු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ මැදිහත්වීමෙන් වේලි ආරක්‍ෂණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ළිං සීයයක් (100) ඉදිකිරීමේ වැඩ සටහන යටතේ නල ළිං ස්ථාන හැට තුනක (63) භූ ජල සමීක්‍ෂණ කර ස්ථාන පනස්තුනක් (53) තෝරන ලද.. මෙම ස්ථාන වලින් ස්ථාන දහතුනක (13) විදුම් කටයුතු සිදු කර අත් පොම්ප සවි කරන ලදී. මෙම ළිං උපයෝගි කර ගනිමින් ජලයේ ගුණාත්මකතාවය අධ්‍යයනය කෙරේ.

   මෙම ව්‍යාපෘතිය යටතේ මහියංගන ආසනයේ ඉදිකර ඇති නල ළිං අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලද අතර, මේ සඳහා ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා විසින් මහත් කැපවීමකින් මේ කටයුතු සංවිධානය කර සාර්ථක කරන ලදී. මෙයට අමතරව රිදීමාලියද්ද ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අප විසින් ඉදිකරන ලද අධි ධාරිතාවයෙන් යුත් නල ළිඳ හේතු කොට ගෙන එම ස්ථානයට නිත්‍ය ජල සැපයුමක් සාදා දී ඇත.

5. ඉහත කාර්යයන් වලට අමතරව ප්‍රදේශයේ ආයතන සහ පුද්ගල ඉල්ලීම් මත මොණරාගල කාර්යාලයට අනුබද්ධව පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

   (i) ජග්රෝ ෆාම්, මීපිලිමාන්න සහ අඹේවෙල පිහිටි ස්ට්‍රෝ බෙරී ෆාම් සඳහා භූ ජල සමීක්‍ෂණ කර සුදුසු ජල ප්‍රභව සොයා දිම සහ වාර්ථා සැපයීම.

   (ii) තණමල්විල මෙත් සෙවන ආබාධිත ළමා නිවාසය සඳහා කරන ලද ඉල්ලීම අනුව භූ ජල සමීක්‍ෂණ කර අධි ධාරිතාවයකින් යුතු නල ළිඳක් ඉදිකර දීම.

   (iii) මොණරාගල වෙල්ලව්චි කඩේ පිහිටි රබර් පර්යේෂණ ආයතනයට නල ළිඳක් ඉදිකිරීම සඳහා භූ ජල සමීක්‍ෂණයක් කරන ලදී.

## 14. වේලි ආරක්‍ෂණ හා ජල සම්පත් සැපසුම්කරණ ව්‍යාපෘතිය

මේ යටතේ ලංකාවේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30ක ජල නිමාන පද්ධති ස්ථාපනය කිරීම සිදුවේ.

1. **ව්‍යාපෘතියේ අභිමතාර්ථය :**

   ශ්‍රී ලංකා භූමිය තුල භූගත ජලය අධීක්‍ෂණය කිරීමේ ජාලයක් නොමැතිකම් ප්‍රතිඵලය නිසාවෙන් ජල ස්ථරයන්ට භූගත ජලය භාවිතය නිසා ඇතිවන තර්ජනය හා බලපෑම භූජල විද්‍යාත්මකව, හඳුනාගෙන නොමැත. ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ භූගත ජල කළමනාකරණ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය වන අතර ජනතාවට හා කර්මාන්තවලට අවශ්‍යය භූගත ජල සම්පත් භාවිතය පිළිබඳව සැලසුම් කිරීම, භූගත ජලය උකහා ගැනීම, සුපරීක්‍ෂණය කිරීම හා නල ළිං ඉදිකිරීමේ කාර්යයන් හි ප්‍රධාන වශයෙන් යෙදී සිටී.

## 2. පසුබිම

තෝරාගත් ප්‍රදේශයන්හි භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වෙනස්වීම් පිළිබඳව අධ්‍යයනයක් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

**වර්තමානයේ මුහුණ දෙන එවන් ගැටලු ලෙස:**

- ජලයේ පවතින ගුණාත්මකතාවයේ ගැටළු
- ලවණ ආක්‍රාන්ති ගැටළු
- නාගරික ජල සම්පාදනයට හා කර්මාන්ත ශාලා වල අවශ්‍යතාවයන්ට භූ ගත ජලය පාලනයකින් තොරව ඇදගැනීම.
- කර්මාන්තශාලා වලින් ඉවතලන  අපජලයෙන්,කෘෂිකර්මාන්තයෙන් හා වෙනත් මාර්ග වලින් භූ ගත ජලය දූෂණය වීම.
- ක්‍රමානුකූල භූගත ජල අධීක්ෂණයක  හා නියාමනයක හිඟකම.

**මෙම ව්‍යාපෘතිය යටතේ**

- ජල සම්පත් මණ්ඩලය විසින් හඳුනාගත් අවදානම් ප්‍රදේශ අධ්‍යනය කිරීම.
- තෝරාගත් නියමු ප්‍රදේශ හය (06) තුල භූ ගත ජල සම්පත් වලට අදාල තොරතුරු එක්රැස් කිරීම
- නියමු ප්‍රදේශ තුල පවතින ළිං භාවිතා කරමින් හා අවශ්‍යතාවය අනුව අළුත් පරීක්ෂණ ළිං ඉදිකරමින් අධීක්ෂණ ජාලයක් පිහිටුවීම.
- නියමු ප්‍රදේශ තුල අවම වශයෙන් වසර තුනක (03) කාලපරිච්ඡේදයක් භූගත ජල ප්‍රමාණය හා ගුණාත්මකතාවය ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම හා විශ්ලේෂණය

නියමු ප්‍රදේශ පහත වගුවේ දැක්වේ.

| **නියමු ප්‍රදේශය** | **තෝරා ගැනීමට හේතුව** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස** | **දිස්ත්‍රික්කය සහ ප්‍රදේශයෙ වර්ගඵලය (ව.කි.මී.)** |
|---|---|---|---|
| ප්‍රදේශය 1(A1) | ක්ෂුද්‍ර ජීවීන් සහ අධික කෘෂිකර්මාන්තය | යාපනය නගරය, නල්ලූර්, චාවකච්චේරි, පච්චිලාපිල්ලෙ | යාපනය අර්ධද්වීපය 418 |
| ප්‍රදේශය 2(A2) | අධික කෘෂිකර්මාන්තය | කල්පිටිය | පුත්තලම 168 |
| ප්‍රදේශය 3(A3) | අධික ලෙස භූගත ජලය උකහා ගැනීම | දඹුල්ල, ගලේවෙල, ලග්ගල, පල්ලේගම, නාඋල, පල්ලේපොල | මාතලේ 1200 |
| ප්‍රදේශය 4(A4) | වකුගඩු ආබාධ | මැදවච්චිය, නුවරගම් පළාත (මධ්‍යම), පදවිය, කැබිතිගොල්ලෑව, රඹෑව, හොරොව්පතාන, කටහටගස්දිගිලිය, ගලෙන්බිඳුනුවැව | අනුරාධපුරය 1990 |
| ප්‍රදේශය 5(A5) | කාර්මික දූෂණය | ගම්පහ, ජා-ඇල, වත්තලල, බියගම, කටාන | ගම්පහ 376 |
| ප්‍රදේශය 6(A6) | ලවණතාවය | පුත්තලම, වනාතවිල්ලුව | පුත්තලම 1012 |

| | | | |
|---|---|---|---|
| ප්‍රදේශය 7(A7) | අධික කෘෂිකර්මාන්තය | සමන්තුරේ, කල්මුනේ, නින්තාවුර්, අඩලච්චේන | අම්පාර 343 |
| ප්‍රදේශය 8 | උස් බිම් ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවයේ වෙනස්වීම | බදුල්ල දිස්ත්‍රික්කය | - |



(අ) වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් විස්තර



යාපනය අර්ධද්වීපයේ භූ ගත ජල කළමනාකරණය
පිළිබඳව දැනුවත්කිරීමේ රැස්වීම



යාපනය දිසාපති ප්‍රධාන අනෙකුත් නිලධාරීන්
දැනුවත් කිරීමේ වැඩසටහන

(ආ) 2011 වසරේදී ඉටුකරන ලද කාර්යයන්



Establishment of base station



DGPS unit assemblage



Measurement at the base

**2.) In-situ determination of chemical parameters (F, NO3, SO4, Cl, Salinity, TDS etc.) in groundwater using field test kit.**



Measuring of Fluoride in groundwater



Field measurement of $NO_3$ in groundwater

## 3.) 2 – D imaging for subsurface groundwater exploration by ERT technique with the use of high end AGI Geophysical equipment system



AGI equipment set up for geophysical survey



ERT array in progress at field



ERT Instrument with console



Switching Unit which link to equipment




2-D visualization after raw data processing in 2-D imaging (EARTH IMAGER) software

4). **නියමු ප්‍රදේශ තුල ජලයේ ගුණාත්මකතාව අධීක්ෂණය කිරීමට හා ජල ස්ථරයන්හි ප්‍රමාණාත්මකතාව නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ නල ළිං ඉදිකිරීම.**



**බියගම ප්‍රදේශයේ පරීක්ෂණ නල ළිං ඉදිකිරීම**

5). **ජල සම්පත් මණ්ඩලයේ භූ ගත ජලය පිළිබඳ දත්ත පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම.**

- අලුතින් වැඩිදියුණු කරන ලද MS-Access වගුවලට අදාල භූ ගත ජලය පිළිබඳ දත්ත Excel sheets වල පිළියෙල කිරීම පරිගණක ඒකකය මගින් සිදු කරමින් පවතීග
- දත්ත පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම ට්‍රෙන්ඩ් ටෙක් ආයතනය මගින් සිදුකර ජල සම්පත් මණ්ඩලය වෙත භාර දී ඇත.




**නියමු ප්‍රදේශය තුල සම්පූර්ණ කරන ලද කාර්යයන් හි සාරාංශය**

- භූ ගත ජලය භාවිත කරන්නන් හා අදාල පාර්ශව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පවතින දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම
- මූලික සිතියම් පිළියෙල කිරීම
- දිගුකාලීන අධීක්ෂණ ජාලයක් පිහිටුවීම සඳහා නොගැඹුරු හා ගැඹුරු ජල ස්ථර ඇතුලත් ස්ථාන හඳුනා ගැනීම
- මෙම ප්‍රදේශයන් තුල භූ ගත ජලය ගලායාමේ දිශාවන් හඳුනාගැනීම සඳහා භූගත ජල මට්ටම් නිමානය
- රසායනික විශ්ලේෂණයන් කිරීම

## 15. ජලයේ රසායනික විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළදී ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරය තුළ රටෙහි විවිධ ප්‍රදේශයන් හි ක්‍රියාත්මක ව්‍යාපෘති වලින් එකතු කර ගන්නා ලද ජල නියැදි හත්සිය දහනමයක (719) රසායනික විශ්ලේෂණයන් කරන ලද අතර, ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ තිස් දෙකක් (32) ද සිදුකරන ලදි. තවද බැරලෝහ විශ්ලේෂණයන් දෙදහස් අටසිය අසූහතක් (2887) ද සිදු කරන ලදි.

ජල විශ්ලේෂණය කිරීමේ පහසුකම් ශක්තිමත් කිරීමේ පියවරක් ලෙසට රුපියල් මිලියන 6.6 ක් පමණ වටිනා නවීන විද්‍යාත්මක උපකරණ හා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මගින් සිදුකරන ලදී.

යාපනයේ පළාත් කාර්යාලයේ රසායනාගාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසන ලදී.

## 16 විදුම් අංශය

සමාලෝචිත වර්ෂය තුළදී නල ළිං එකසිය පනස් දෙකක් (152) ඉදිකරන ලද අතර නල ළිං තිස් හතක් (37) පිරිසිදු කර ප්‍රතිසංස්කරණය කිරීම් පහක් (05) හා අත්පොම්ප සවිකිරීම් හැත්තෑ එකක් (71) ක් සිදු කරන ලදී

## 17. ඉදිකිරීම් වැඩ

2011 වර්ෂය තුළදී පහත සඳහන් ඉදිකිරීම් කාර්යයන් ක්‍රියාවට නංවන ලද.

### 17. 1 ප්‍රධාන කාර්යාලය

01 ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ඇති ගොඩනැගිලි සඳහා සිවිලිම් ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම

02 ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ගරාජය ඉදිකිරීමේ කටයුතු නිම කිරීම

### 17. 2 රත්මලාන වැඩබිම

01. විදුලි පද්ධතියේ අලුත්වැඩියාවන් හා ගොඩනැගිලි නඩත්තු වැඩ ක්‍රියාත්මක කරන ලදි

02. රත්මලාන වැඩ බිමේ ආරක්ෂක කුටිය ඉදිකිරීමේ කටයුතු නිමකිරීම.

### 17. 3 පලාත් කාර්යාලය - මොනරාගල

01. මොණරාගල පළාත් කාර්යාලයේ වහලයේ හා සිවිලිමේ අළුත්වැඩියා නිම කිරීම.

## 18. යාන්ත්‍රික වැඩපළ - රත්මලාන

### 18. 1 වාහන සුළු අලුත්වැඩියාවන්

රත්මලාන යාන්ත්‍රික වැඩපල මගින් මණ්ඩලයේ වාහනවල, සුළු අලුත්වැඩියාවන් සිදු කරන ලද.. ලොරි රථ අලුත්වැඩියා දහතුනක් (13) හා කැබ් රථ අලුත්වැඩියා එකොළහක් (11) මෝටර් කාර් අලුත්වැඩියා අටක් (08) ජීප් රථ අලුත්වැඩියා හයක් (06) විදුම් යන්ත්‍ර අලුත්වැඩියා හතරක් (04) ඇතුළත්ව සුළු අලුත්වැඩියා කාර්යයන් හතලිස් දෙකක් (42) සිදුකරන ලද... එක් ජීප් රථයක හා ලොරි රථ තුනක (03) වැසි, තහඩුවැඩ හා පින්තාරු වැඩ සම්පූර්ණයෙන් නිම කරන ලද..

### 18. 2 විදුම් යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා ඒකකය

ජල සම්පත් මණ්ඩලයේ විදුම් යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියාවන් හා නඩත්තු කිරීම යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා අංශය මගින් සිදු කරනු ලබයි. ගතවූ වර්ෂය තුළදීත් සියලුම විදුම් යන්ත්‍ර හා වායුපිඩන

යන්ත්‍රවල සේවා කටයුතු හා අලුත්වැඩියා කටයුතු මෙම ඒකකය මගින් ඉටු කරන ලදී. ඒ අනුව විදුම් යන්ත්‍ර අලුත්වැඩියාවන් එකොළහක් (11) හා වායු පීඩන යන්ත්‍ර අලුත්වැඩියාවන් තුනක් (03) සිදුකර ඇත.

## 18. 3 යාන්ත්‍රික වැඩපල

2011 වසර තුළදී සුළං බල යන්ත්‍ර දෙකක අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර ප්‍රධාන කාර්යාලයේ ගරාජය සකස්කිරීම හා ලිපිගොනු අල්මාරි විසිහතරක් (24) නැවත තීන්ත ආලේප කිරීම ද කරන ලදී.

## 18. 4 වාහන සේවා ස්ථානය

රත්මලාන වැඩබිමේ මණ්ඩලයේ වාහන සේවා කිරීම සඳහා සේවා ස්ථානයක් සමාලෝචිත වසර තුළදී ආරම්භ කරන ලද අතර වාහන වල සේවාවන් පනස් හතරක් (54) වර්ෂය තුළදී සිදුකරන ලදී.

## 19. අභ්‍යන්තර විගණන අංශය

රජයේ විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හතරක් (04)සඳහා අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නා ලද අතර, අභ්‍යන්තර විගණන වාර්තා හයක් (06) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

## 20. මූල්‍ය

සමාලෝචිත වර්ෂය තුළදී උපයාගන්නා ලද මුළු ආදායම රු. 81,172,412/- ක. 2011 වර්ෂය තුළදී රු. 64,300,000/- ක රු.10,855,506/- ක මුදලක් පිළිවෙලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන ලෙසට මහා භාණ්ඩාගාරයෙන් ලැබුණ.. වර්ෂය තුළ රු. 46,898,869/- ක මෙහෙයුම් ඌනතාවයක් ද වේ.

මණ්ඩලයේ වත්කම් කළමනාකරණය කර පවත්වාගෙන යාම සඳහා වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් ස්ථාපනය කිරීමට කටයුතු සිදුකරන ලද අතර එමගින් සියළු වත්කම් හා ප්‍රධාන ගබඩාවේ තොග පරිඝණක ගත කිරීම සිදුවේ.

## 21. පාලන

2011 වසර තුළදී ජල සම්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව දෙසිය හැට දෙකක් (262) වන අතර, ඉන් කොන්ත්‍රාත් පදනම මත සේවකයින් තිදෙනෙක් ද (03) අනියම් පදනම මත සේවකයින් හත් දෙනෙක් ද (07) සේවයේ යෙදී තිබුණ. වර්ෂය තුළදී සේවකයින් දාහතර (14) දෙනෙක් ස්ථිර සේවයට ද කොන්ත්‍රාත් පදනම මත සේවකයින් තිදෙනෙක් ද (03) අනියම් පදනම මත සේවකයින් හත් දෙනෙක් ද (07) සේවයට බඳවාගෙන ඇත. වසර තුල හයදෙනෙක් (06) සේවයෙන් ඉල්ලා අස්වූ අතර, හතර දෙනෙක් (04) සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී

## 22. මානව සම්පත් සංවර්ධනය

මණ්ඩලයේ සේවාවන්හි ඵලදායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සේවකයින් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමේ පියවර ගන්නා ලදී විධායක නිලධාරීන්ද ඇතුළුව කෙටිකාලීන පුහුණු පාඨමාලාවලට හත් දෙනෙක් (07)ද සහතික පත්‍ර පාඨමාලාවලට හය දෙනෙක් (06)ද දහතුන් දෙනෙකු (13) වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට ද යොමු කිරීමට පියවර ගන්නා ලදී එක් අයෙකු විදේශ ශිෂ්‍යත්වයක් සඳහා යොමු කිරීමට ද පියවර ගන්නා ලදී.

## 23. සුභසාධක පහසුකම්

ජල සම්පත් මණ්ඩලයේ සුභසාධක හා ක්‍රීඩා සංගමය වෙත සමාලෝචිත වර්ෂය තුළදී සුභසාධක පහසුකම් හා මරණාධාර ක්‍රමය යටතේ සාමාජිකයන්ගේ මරණ සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට හා වෙනත් සුභ

සාධක පහසුකම් සැපයීම සඳහා රුපියල් දෙලක්ෂ අනූ හතර දහස් එකසිය හයක (රු.294,106/-) මුදලක් හා මණ්ඩලයේ සේවකයින් හට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ වෛද්‍ය පහසුකම් වෙනුවෙන් වැයවූ මුදල් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හතර දහස් නමසිය හැටපහක (රු. 374,965/-) මුදලක් ලබා දෙන ලදි. ජල සම්පත් මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් හට රට තුල ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති දැක බලා ගැනීමටත් මණ්ඩලයේ පළාත් කාර්‍යාල මෙම සංවර්ධන ක්‍රියාවලියට දායකවන ආකාරය ගැන දැනුවත් කිරීමේ දින තුනක අධ්‍යාපනික වැඩ සටහන් චාරිකාවක් වසර අවසානයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම මත සංවිධානය කරන ලදී.

## 24. ප්‍රවාහන ඇනිය

සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ ප්‍රවාහන ඇනිය වාහන හතලිස් පහකින් (45) සමන්විත විය. මේවා අතුරින් වාහන විසිනමයක් (29) ධාවන තත්වයේ පැවති අතර, ඒවා කැබ් රථ , කාර්, ජීප්, ලොරි හා ට්‍රැක්ටර් හා ක්‍රේන් ආදී වාහනවලින් සමන්විත විය. 2011 වසරේ වේලි සංරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක් (01) කැබ් රථයක් හා මණ්ඩලයේ මුදල් ප්‍රතිපාදන මත අලුත් කැබ් රථ තුනක්(03) හා ත්‍රී රෝද රථයක් ප්‍රවාහන ඇනියට එකතු විය

## 25. අනුරාධපුර සංචාරක නිවස

මුලික වශයෙන් ජල සම්පත් මණ්ඩලයේ හා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යංශයේ සේවක මහත්ම මහත්මීන්ගේ රාජකාරි කටයුතු වලදී හා විවේක ගතකිරීමේ කටයුතු වලදී නවාතැන් පහසුකම් සැලසීම සඳහා මෙම සංචාරක නිවස පවත්වාගෙන යනු ලැබේ. ඊට අමතරව, අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සේවකයින් හට හා සාමාන්‍ය මහජනතාව සඳහා නවාතැන් ගැනිම සඳහා ද ඉඩ පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 26. බෞද්ධ සංගමය

ජල සම්පත් මණ්ඩලයේ බෞද්ධ සංගමය 1999=05=05 දින ආරම්භ කරන ලද. 2011 වසර තුළ වෙසක් පෝය දින කාර්යාල පරිශ්‍රය සැරසීමට හා පොසොන් පොහොය දින, ජල සම්පත් මණ්ඩලයේ සේවයේ යෙදී සිට මියගිය සාමාජිකයින් හට පිං පැමිණවීම පිණිස ධර්ම දේශනාවක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

## 27. ස්තුතිය

මණ්ඩලයේ කාර්යය ඉටු කිරීමේදී ඊට විශේෂ අනුග්‍රහය දක්වන ලද වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාට හා වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමාටද, එම අමාත්‍යංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ට හා කාර්‍ය මණ්ඩලයට ද, රජයේ වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා මණ්ඩල, විදේශිය ආයතනවල හා පෞද්ගලික අංශයේ ආයතනවල සියලු නිලධාරීන්ට හා උපදේශකයින්ට සිය ස්තුතිය සටහන් කොට තැබීම මණ්ඩලයට සතුටකි. ජල සම්පත් මණ්ඩලයේ කාර්යයන් කාර්‍යක්ෂමව ඉටුකරමින් පක්ෂපාතිව සිය සේවාවන් ඉටුකිරීම ගැන ජල සම්පත් මණ්ඩලයේ සේවක මණ්ඩලයටද කෘතඥතාවය පුද කරමි.

අත්සන් කළේ,

බන්ධුල මුණසිංහ
සභාපති,
ජල සම්පත් මණ්ඩලය,
2 ඒ ,හෙක්ටර් කොබ්බෑකඩුව මාවත ,
කොළඹ 07

2012-11-05

## 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් ප්‍රකාශනය

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම** | | | |
| භූ ජල සමීක්ෂණ /භූගත ජල ගවේෂණය හා සංර්ධනය | **01** | 58,813,685 | 39,825,912 |
| භූගත ජල අධීක්ෂණය | **02** | 4,977,711 | - |
| භූගත ජල සංර්ධනය | **03** | 14,574,730 | 19,803,509 |
| වෙනත් ප්‍රභවයන්ගෙන් ලත් ආදායම | **04** | 2,806,286 | 2,040,653 |
| **ක්‍රියාකාරකම් වලින් ලත් ආදායම** | | **81,172,412** | **61,670,073** |
| **භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන** | | | |
| පර්යේෂණ අධ්‍යනයන් - මෙයෙයුම් | **05** | 10,855,506 | 4,981,846 |
| **මහා භාණ්ඩාගාරයේ දායකය (පුනරාවර්තන)** | | **64,300,000** | **65,000,000** |
| **මුළු ආදායම - (1+2+3)** | | **156,327,918** | **131,651,919** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගලික පඩිනඩි | 6:1 | 92,600,961 | 80,103,010 |
| ගමන් වියදම් | 6:2 | 6,882,161 | 5,722,241 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 6:3 | 34,120,432 | 19,308,047 |
| ගිවිසුම් ගත සේවා | 6:4 | 3,751,269 | 3,185,262 |
| නඩත්තු | 6:5 | 6,686,573 | 5,706,877 |
| සුභසාධක පහසුකම් | 6:6 | 869,041 | 638,682 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 6:7 | 3,715,662 | 4,097,028 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම් | 6:8 | 10,855,506 | - |
| ක්ෂයවීම් | | 43,745,182 | 5,755,881 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **203,226,787** | **124,517,028** |
| **කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)** | | **(46,898,869)** | **7,134,891** |

**ජල සම්පත් මණ්ඩලය**

## 2011.12.31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත හා උපකරණ | **07** | 111,060,372 | 64,082,358 |
| කෙරීගෙන යන වැඩ - (යන්ත්‍රෝපකරණ 2 කේ ආර් ව්‍යාපෘතිය) | | 46,167,438 | 50,959,293 |
| | | **157,227,810** | **115,041,651** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 08 | 29,338,542 | 16,904,483 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 09 | 13,748,394 | 14,355,660 |
| කලට පෙර ගෙවීම් | 10 | 43,781 | 40,089 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 14,466,450 | 25,908,329 |
| | | **57,597,167** | **57,208,560** |
| **මුළු එකතුව** | | **214,824,977** | **172,250,211** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත වගකීම් | 12 | 62,968,322 | 58,544,345 |
| ගෙවිය යුතු දෑ | 13 | - | 240,000 |
| | | **62,968,322** | **58,784,345** |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 14 | 18,750,986 | 17,333,903 |
| උපචිත වියදම් | 15 | 6,565,238 | 4,519,612 |
| ආරක්ෂක තැන්පතු | 16 | 16,631 | 9,500 |
| | | **25,332,855** | **21,862,534** |
| **මුළු වගකීම්** | | **88,301,177** | **80,646,879** |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 17 | 179,601,206 | 174,760,903 |
| විදේශාධාර | 17 | 206,542,220 | 129,824,942 |
| අඩු කලා: සමුච්චිත අලාභය | 17 | (263,608,236) | (216,758,623) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 17 | 3,988,610 | 3,776,110 |
| **මුළු ස්කන්ධය** | | **126,523,800** | **91,603,332** |
| **මුළු වගකීම් ස්කන්ධය** | | **214,824,977** | **172,250,211** |

මෙම ගිණුම් ප්‍රකාශන සමස්ත පරිපූර්ණය සඳහා අවශ්‍යය වන ගණකාධිකරණ ප්‍රමිතීන් හා සටහන් පිටු අංක 05 සිට 14 තෙක් දැක්වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමතකර අත්සන් කලෙමු.

**අ.කලේ: බන්ධුල මුණසිංහ**
**සභාපති**

**අ.කලේ: වෛද්‍ය පී.එස්.ඒ.කෝදාගොඩ**
**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

2012.04.30
ජල සම්පත් මණ්ඩලය

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
## 2011 දෙසැම්ර් 31 දිනට ශේෂය

සටහන - 17

| | සමුච්චිත අරමුදල රු. | විදේශාධාර රු. | විදේශාධාර ප්‍රදාන රු. | ප්‍රත්‍යාගනන අතිරික්තය රු. | සමුච්චිත ලාභ/අලාභ රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | 170,668,681 | 72,376,910 | 105,071,709 | 7,827,360 | (225,699,922) | 130,244,738 |
| වසර සඳහා දායකය/එකතුකිරීම් | 4, 092,223 | - | 10,112,186 | - | - | 14,204,409 |
| මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශන වල හඳුනා නොගත් ශුද්ධ ලාභ /(පාඩු) | | (34,754,899) | (22,680,964) | (4,051,250) | 1,806,407 | (59,980,706) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාවය | | | | | 7,134,891 | 7,134,891 |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **174,760,904** | **37,622,011** | **92,202,931** | **3,776,110)** | **(216,758,623)** | **91,603,332** |
| වසර සඳහා දායකය/එකතුකිරීම් | 4,890,000 | | 76,717,278 | | | 81,607,278 |
| ස්ථාවර වත්කම් පොත් වලින් ලියාහැරීම් | (49,698) | | | (49,698) | | |
| මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශන වල හඳුනා නොගත් ශුද්ධ ලාභ /(පාඩු) | | | | 212,500 | 49,256 | 261,756 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | | | | | (46,898,869) | (46,898,869) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **179, 601,206** | **37,622,011 (1)** | **168,920,209 (2)** | **3,988,610** | **(263,608,236)** | **126,523,799** |

## විදේශාධාර /රජයේ ප්‍රදාන

| | |
|---|---|
| ජයිකා JICA | 11,973,125 |
| ආසියානු සංවර්ධන බැංකුව සහ ජාතික ජල සම්පත් අධිකාරිය | 1,024,650 |
| වෙනත් | 24,624,236 |
| | 37,622,011 |
| | **(1)** |

| වෙනත් ප්‍රදාන | 2010.12.31 දිනට පිරිවැය | වසර සඳහා එකතුකිරීම් | 2011.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|
| පුහුණු මධ්‍යස්ථානය සඳහා ප්‍රදාන | 933,668 | 356,511 | 1,290,179 |
| ජපන් 2 ණයසෘ ව්‍යාපෘතිය | 81,476,312 | - | 81,476,312 |
| ඇමරිකානු මුදල් ප්‍රදාන | 1,770,632 | - | 1,770,632 |
| වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 8,022,319 | 75,427,306 | 83,449,625 |
| | - | 933,461 | 933,461 |
| | 92,202,93 | 176,717,278 | 168,920,209 |
| | **(4)** | **(3)** | **(2)** |

**ජල සම්පත් මණ්ඩලය**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
# 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | 2011 | | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | |
| පොලී ආදායමට පෙර වර්ෂයේ ලාභය/අලාභය | | (46,898,869) | | 7,134,891 |
| **එකතුකලා/අඩුකලා: පෙර වසර ගැලපීම්** | 1,060,120 | 1,060,120 | 1,806,407 | 1,806,407 |
| | | 48,838,749 | | 8,941,298 |
| **එකතුකලා:** ක්ෂයවීම් | 43,745,182 | | 5,755,881 | |
| පාරිතෝෂික වෙන් කිරීම් | 7,051,124 | 50,796,306 | 310,143 | 6,066,024 |
| මෙහෙයුම් ශුද්ධ ලාභය/(අලාභය) කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර | | **4.957,557** | | **15,007,322** |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් | | | | |
| තොග (වැඩිවීම)/ අඩුවීම | (12,434,059) | | (3,999,439) | |
| ණයගැති (වැඩිවීම)/ අඩුවීම | 607,265 | | 20,993,883 | |
| බලට පෙර ගෙවීම් (වැඩිවීම)/ අඩුවීම | (3,692) | | 40,220 | |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/ (අඩුවීම) | 1,417,565 | | (984.639) | |
| උපචිත වියදම් වැඩිවීම/ (අඩුවීම ) | 1,812,756 | (8,600,165) | (1,208,351) | 14,841,674 |
| **මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,642,608)** | | **29,848,996** |
| **ආයෝජන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (10,062,122) | | (7,063,959) | |
| පාරිතෝෂික ගෙවීම් | (2,627,146) | | (3,530,755) | |
| **ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(12,689,268)** | | **(10,594,714)** |
| **මූල්‍ය කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | |
| රජයේ ප්‍රදාන | 4,890,000 | | 4,092,223 | |
| **මූල්‍ය කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,890,000** | | **4,092,922** |
| **වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(11,441,878)** | | **23,346,505** |
| **වර්ෂයේ මුල මුදල් හා මුදල් සමාන දෑ** | | **25,908,329** | | **2,561,824** |
| **වර්ෂයේ අග මුදල් හා මුදල් සමාන දෑ** | | **14,466,451** | | **25,908,329** |

## 5 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම ස'දහා අදාල කරගත් මූලික ගිණුම්කරන ප්‍රතිපත්තින් පහත පරිදි වේ.

### 1. සැකසීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට හා ඓතිහාසික පිරිවැය පදනම මත අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ගිණුම්කරණ කාල පරිච්ඡේදයට උපචිත වූ ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශය වාර්තාකරණයට අදාල කරගෙන ඇත.

### 2. වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

#### 2.1 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමමුච්ත ක්ෂය අඩුකල අගයටය. එහි පිරිවැය සමග අනෙකුත් අත්පත් කර ගැනිමේ වියදම් ද ඇතුළුව ගණන් ගැනේ.

#### 2.2 ක්ෂයවීම්

වත්කම් මිළදි ගත් වර්ෂයේදි ක්ෂය නොකරන අතර ඉවත් කරන වර්ෂයේදි සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබේ.වත්කම් වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නෙ සරල මාර්ගිකව ඒවායේ පිරිවැය අපේක්ෂිත ආයු කාලය මත බෙදා හැරීමෙනි.මේ සඳහා භාවිතා කරන වාර්ෂික ක්ෂය අනුපාතයන් මෙසේය.

| | |
|---|---|
| මෝටර් වාහන | 25% |
| යන්ත්‍ර සූත්‍ර මෙවලම් උපකරණ | 20% |
| රසායනාගාර මෙවලම් උපකරණ | 20% |
| විද්‍යාත්මක උපකරණ | 20% |
| පුස්ථකාල පොත් | 20% |
| ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ | 10% |
| පරිගණක | 20% |
| ;ාවකාලික ගොඩනැගිලි | 33 1/3% |
| ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් | 33 1/3% |
| යන්ත්‍ර හා වාහන වැඩි දියුණු කිරීම් | 33 1/3% |

විදේශාධාර මත ලබාගත් වත්කම් සම්බන්ධයෙන් අදාල ක්ෂයවීම

විලම්භිත ආදායම් ලෙස හිලව් කරනු ලැබේ.

<u>වත්කම් ඉවත් කිරිම සඳහා වූ ක්ෂය වීම</u>

ඉවත් කරනු ලබන වත්කම් වලට අදාල ක්ෂයවීම් ඒවා ඉවත් කරන දින දක්වා ගණන් ගනු ලැබේ.

### 3. තොග

තොගය සඳහා වාහන අමතර කොටස් ගබඩා ද්‍රව්‍ය යන්ත්‍ර අමතර කොටස් ඉන්ධන හා වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය අන්තර්ගත වේ. පළමු නිකුත් කිරීමේ පිරිවැය ක්‍රමය මත ඒවා ගණනය කරනු ලැබේ. කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැයට ගණනය කරන අතර, එයට අදාල ඍජු ද්‍රව්‍ය හා ඍජු ශ්‍රම පිරිවැයද අදාල කරගනු ලැබේ.

## 4. ලැබිය යුතු ගිණුම්

4.1 ලැබිය යුතු ගිණුම් ඒවා උපලබ්ධි වීමට නියමිත ඇස්තමේන්තු මත ගණන් ගනු ලැබේ.

### 4.2 බොල් හා අඩමාන ණය

සියලුම ඉන්වොයිස් නව බිල්පත් අඛණ්ඩව ඇගයීමකින් පසුව හඳුනාගැනීම මත බොල් හා අඩමාන ණය අලාභයන් ඇස්තමේන්තු කරනු ලැබේ.

## 5. වගකීම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර නිශ්චිතවම ප්‍රමාණයක් ගණනය කල නොහැකි වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කෙරේ.

## 6. විලම්භිත වගකීම්

### 6.1 විශ්‍රාම පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලස්වා ඇත. ඒ සඳහා සේවකයින්ගේ අඛණ්ඩ සේවා කාලය සැලකිල්ලට ගෙන සෑම මූල්‍ය වර්ෂයකම අවසන් වන මාසයේ වැටුප් හා ව්‍යවස්ථාපිත දීමනාද එකතුව මූලික වැටුපෙන් අඩක් වන පරිදිය.

## 7. බදුකරණය

### 7.1 ආදායම් බදු

පවත්නා හා පෙර ගිණුම් වර්ෂ සැලකිල්ලට ගෙන පවතින අලාභයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන සලස්වා නොමැත.

### 7.2 එකතු කල අගය මත බදු

දේශීය ආදායම් කොමසාරිස්ගේ අනුමැතිය මත එකතු කල අගය මත බදු ප්‍රේෂණයන් කරනු ලබන්නේ මුදල් පදනම අනුවය.

# ගිණුම් සඳහා වූ සටහන්

## ආදායම්

සටහන් .1

| | 2011 | 2010 |
|---|---|---|
| **භූ ජල සමීක්ෂණ/භූගත ජල ගවේෂණය** | රු. | රු. |
| භූ ජල සමීක්ෂණ | 4,616,928 | 7,288,957 |
| නල ලිං ඉදිකිරීම | 43,155,836 | 27,843,612 |
| අත් පොම්ප සවිකිරීම | 3,945,607 | 1,418,125 |
| ජල ධාරිතා පරීක්ෂණ | 2,737,943 | 1,692,600 |
| නල ලිං පිරිසිදු කිරීම | 2,521,993 | 1,085,292 |
| ජල නියැදි විශ්ලේෂණය | 1,835,378 | 497,325 |
| **එකතුව** | **58,813,685** | **39,825,912** |

**සටහන් .2**

| | | |
|---|---|---|
| භූගත ජල අධීක්ෂණය | | |
| වේලි සංරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය | 4,977,711 | - |
| **එකතුව** | **4,977,711** | |

**<u>සටහන් .2</u>**

| | | |
|---|---|---|
| භූගත ජල අධීක්ෂණය | | |
| භූජල සංවර්ධනය (මැන්රිප් - ජයිකා) | 14,118,464 | 11,554,860 |
| සුළං බල යන්ත්‍ර නිෂ්පාදනය | 110,440 | 360,112 |
| භූගත ජලය කෘතිමව ආරෝපණය කිරීම(ඉං.මහා කොම.) | - | 60.3,095 |
| මොණරාගල ව්‍යාපෘතිය | - | 1,204,954 |
| නැගෙනහිර පළාතේ අත්පොම්ප නල ලිං ව්‍යාපෘතිය(භාණ්. අර.) | - | 3,365,400 |
| ජලය පිරිපහදුකිරීමේ ව්‍යාපෘතිය | 338,826 | 375,088 |
| උතුරු වසන්තය ලිං පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය | - | 2,340,000 |
| භූජල දත්ත විකිණීමේ ආදායම | 7,000 | - |
| **එකතුව** | **14,574,730** | **19,803,509** |

**සටහන් .4**

| | | |
|---|---|---|
| වෙනත් ප්‍රභවයන්ගෙන් ලත් ආදායම | | |
| සංචාරක නිවාස ආදායම | 105,155 | 98,471 |
| ණය පොලී සහ බැංකු පොළී | 1.012,643 | 374,709 |
| දඩ මුදල් හා අධිභාර | 1,177,959 | 42,339 |
| කොරකහවැව ගොවිපල ආදායම | 964 | 14,256 |
| විවිධ ආදායම් | 330,767 | 147,663 |
| කපා හරින ලද ණය ලැබීම(සන්පේලවර් ව්‍යාපෘතිය) | - | 1,363,215 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය | 178,798 | - |
| **එකතුව** | **2,806,286** | **2,040,653** |

**සටහන් : 5**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන**

| | | |
|---|---|---|
| පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම් | | |
| දැනුවත්කිරීමේ වැඩසටහන්/ජල නියැදි විශ්ලේෂණය(අ,පුර) | 1,993,500 | 4,763,746 |
| සේවක පුහුණුකිරීම් | 290,764 | 218,100 |
| කොළඹ සිට මීගමුව දක්වා ඇති වෙරළබඩ ජල ධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය | 7,366,539 | - |

| | | |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ස්ථරවල ජලයේ ගුණාත්වය වෙනස්වීම් අධ්‍යනය | 1,149,990 | - |
| පුත්තලම ජලස්ථරවල සමස්ථානික භාවිතයෙන් අධ්‍යනය | 33,380 | - |
| තොරතුරු සිතියම්ගත කිරීම | 21,333 | - |
| **එකතුව** | **10,855,506** | **4,981,846** |

**ගිණුම් සඳහා වූ සටහන්**

සටහන් අංක 6 : 1

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **පුද්ගලික පඩි නඩි** | | |
| වැටුප් හා වේතන | 71,546,242 | 66,779,246 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 6,259,291 | 5,543,821 |
| සේවක අර්ථ සාධක අරමුදල ගෙවීම - 12% | 5,866,495 | 5,953,130 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම - 3% | 1,466,573 | 1,488,120 |
| අධ්‍යක්‍ෂ දීමනා | 404,227 | 15,000 |
| වෙනත් දීමනා | 32,750 | 13,550 |
| පාරිතෝෂික | 7,025,383 | 310,143 |
| **එකතුව** | **92,600,961** | **80,103,010** |

සටහන් අංක 6 : 2

| | | |
|---|---|---|
| ගමන් වියදම් හා යැපීම් දීමනා | | |
| ගමන් වියදම් - දේශීය | 6,882,161 | 5,662,714 |
| ගමන් වියදම් - විදේශීය (දීමනා) | - | 59,527 |
| එකතුව | **6,882,161** | **5,722,241** |

සටහන් අංක 6 : 3

| | | |
|---|---|---|
| **සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය** | | |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 14,454,648 | 10,110,528 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (299,198) | (448,370) |
| වර්ෂය සඳහා පිරිවැය | **14,155,450** | **9,662,158** |
| **විදුම් හා පාරිභෝජන ද්‍රව්‍ය** | 34,347,815 | 17,379,015 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (15,974,780) | (8,161,533) |
| වර්ෂය සඳහා පිරිවැය | **18,373,035** | **9,217,482** |
| රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය | 3,099,978 | - |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (1,880,571) | - |
| වර්ෂය සඳහා පිරිවැය | 1,219,407 | 324,332 |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 372,540 | 104,076 |
| **එකතුව** | **34,120,432** | **19,308,047** |

සටහන් අංක **6 : 4**

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **ගිවිසුම්ගත සේවා** | | |
| තැපැල් හා දුරකතන | 959,797 | 863,546 |
| විදුලිය ගාස්තු | 1,349,911 | 1,058,046 |
| කුලී, වරිපනම් හා බදු | 666,451 | 396,949 |
| මාර්ගස්ථ මුදල් රක්‍ෂණය | 11,169 | 2,799 |

| | | |
|---|---|---|
| විගණන ගාස්තු | 158,000 | 125,000 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 171,312 | 82,442 |
| වැඩ මුළු හා සම්මන්ත්‍රණ | 18,150 | 237,031 |
| ජල බිල්පත් | 73,706 | 109,223 |
| උපදේශක ගාස්තු | 44,370 | 47,586 |
| විවිධ වියදම් | 298,403 | 262,641 |
| **එකතුව** | **3,751,269** | **3,185,262** |

සටහන් අංක **6 : 5**

**නඩත්තු හා අළුත්වැඩියාව**

| | | |
|---|---|---|
| **මෝටර් වාහන** | | |
| **නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය** | 5,298,991 | 4,007,598 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (1,150,589) | (709,089) |
| **වර්ෂය සඳහා පිරිවැය** | **4,148,402** | **3,298,509** |
| **යන්ත්‍රෝපකරණ** | | |
| **නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය** | 7,794,271 | 8,557,064 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (6,518,452) | (6,910,794) |
| **වර්ෂය සඳහා පිරිවැය** | **1,275,819** | **1,646,271** |
| **කාර්යාල උපකරණ** | | |
| **නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය** | 737,287 | 799,526 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (76,822) | (94,595) |
| **වර්ෂය සඳහා පිරිවැය** | **660,465** | **704,931** |
| **ගොඩනැගිලි** | | |
| **නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය** | 995,417 | 443,676 |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (393,530) | (386,509) |
| **වර්ෂය සඳහා පිරිවැය** | **601,887** | **57,167** |
| **එකතුව** | **6,686,573** | **5,706,877** |

සටහන් අංක **6 : 6**

**සුභසාධක වියදම්**

| | | |
|---|---|---|
| **සුභසාධක වියදම්** | 294,106 | 143,990 |
| වෛද්‍යාධාර ගෙවීම | 374,965 | 408,515 |
| සංග්‍රහ වියදම් | 190,530 | 77,268 |
| ඉතිරි විවේක නිවාඩු සඳහා ගෙවීම | 9,440 | 8,909 |
| **එකතුව** | **869,041** | **638,682** |

සටහන් අංක **6 : 7**

**වෙනත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල ද්‍රව්‍ය | 204,944 | 272,783 |
| නිල ඇඳුම් | 347,908 | 18,118 |
| සඟරා හා පුවත්පත් | 90,610 | 46,474 |

| | | |
|---|---|---|
| ප්‍රචාරණ හා දැන්වීම් වියදම් | 472,391 | 597,905 |
| බැංකු ගාස්තු | 118,987 | 82,587 |
| සේවක රක්ෂණය | - | 117,485 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 27,360 | - |
| නීති වියදම් | 277,274 | 5,490 |
| දඩ හා අයකිරීම් | 24,240 | - |
| බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 1,012,510 | 957,707 |
| ආර්ථික සේවා ගාස්තු | 556,577 | 558,921 |
| පරිත්‍යග | - | 5,000 |
| මුද්දර බදු | 4,500 | 4,450 |
| වාහන සේවාකිරීම් - රත්මලාන | 156,030 | 328,667 |
| වාහන කුලී වියදම් | 132,516 | 498,800 |
| පුහුණු මධ්‍යස්ථානයේ වියදම් (අනුරාධපුර) | 111,017 | 602,640 |
| දැයට කිරුළ ප්‍රදර්ශන වියදම් | 178,798 | - |
| **එකතුව** | **3,715,662** | **4,097,028** |

සටහන් අංක **6 : 8**

**ව්‍යාපෘති වියදම් (භාණ්ඩාගාර ප්‍රතිපාදන)**

**කොළඹ සිට මීගමුව දක්වා ඇති වෙරළබඩ ජල ධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | | 1,176,535 |
| සේවක අර්ථ සාධක අරමුදල ගෙවීම - 12% | | 73,776 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම - 3% | | 18,441 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | 114,821 |
| ගමන් වියදම් | | 147,852 |
| ලිපි ද්‍රව්‍ය හා කන්තෝරු ද්‍රව්‍ය | | 483 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,188,190 | |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (312,792) | 875,398 |
| ප්‍රචාරණ හා දැන්වීම් වියදම් | | 20,966 |
| භූජල වෙනත් වියදම් | | 1,445 |
| විදුම් වැඩ පාරිභෝජන ද්‍රව්‍ය | 7,188,406 | |
| අඩුකලා: දෙසැ. 31 දිනට තොග | (2,424,417) | 4,763,989 |
| මෝටර් වාහන නඩත්තුව | | 21,310 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | | 3,875 |
| විද්‍යාගාර උපකරණ නඩත්තුව | | 8,950 |
| ගොඩනැගිලි නඩත්තුව | | 485 |
| ;ැපැල් හා දුරකතන | | 18,013 |
| විවිධ වියදම් | | 200 |
| කුලී, වරිපනම් හා බදු | | 120,000 |
| **උප එකතුව** | | **7,366,539** |

**දැනුවත්කිරීමේ වැඩසටහන්/ජල නියැදි විශ්ලේෂණය(අ,පුර)**

| | |
|---|---|
| වැටුප් හා වේතන | 79,698 |
| සේවක අර්ථ සාධක අරමුදල ගෙවීම - 12% | 6,423 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම - 3% | 1,633 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 229,886 |
| ගමන් වියදම් | 99,144 |
| ලිපි ද්‍රව්‍ය හා කන්තෝරු ද්‍රව්‍ය | 176,198 |

| | |
|---|---|
| පුහුණු මධ්‍යස්ථානයේ වියදම් (අනුරාධපුර) | 1,144,297 |
| ගොඩනැගිලි නඩත්තුව | 12,900 |
| කාර්යාල උපකරණ නඩත්තුව හා අළුත්වැඩියාව | 23,115 |
| විද්‍යාගාර උපකරණ නඩත්තුව | 71,460 |
| භූජල වෙනත් වියදම් | 120,960 |
| විදුම් වැඩ පාරිභෝජන ද්‍රව්‍ය | 27,786 |
| **උප එකතුව** | **1,993,500** |

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ස්ථරවල ජලයේ ගුණාත්වය වෙනස්වීම් අධ්‍යනය**

| | |
|---|---|
| වැටුප් හා වේතන | 577,977 |
| සේවක අර්ථ සාධක අරමුදල ගෙවීම - 12% | 44,811 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම - 3% | 11,230 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 39,120 |
| ගමන් වියදම් | 61,225 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 126,762 |
| විද්‍යාගාර උපකරණ නඩත්තුව | 237,630 |
| මෝටර් වාහන නඩත්තුව | 51,235 |
| **උප එකතුව** | **1,149,990** |

**සිතියම් රැස්කිරීම**

| | |
|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,508 |
| ගමන් වියදම් | 16,825 |
| **උප එකතුව** | **21,333** |

**පුත්තලම ජලස්ථරවල සමස්ථානික භාවිතයෙන් අධ්‍යනය**

| | |
|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 10,260 |
| ගමන් වියදම් | 23,120 |
| **උප එකතුව** | **33,380** |

**සේවක පුහුණුවීම්**

| | |
|---|---|
| වැඩ මුළු හා සම්මන්ත්‍රණ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 290,764 |
| **උප එකතුව** | **209,764** |
| **එකතුව** | **10,855,506** |

ගිණුම් සඳහා වූ සටහන්
සටහන් අංක. 7

**දේපල, පිරියත හා උපකරණ**

<u>ස්ථාවර වත්කම්</u>

| | 2010.12.31 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන අගය රු. | වර්ෂයේ එකතුකිරීම් රු. | ඉවත් කිරීම්/ ගැලපීම් රු. | **2011.12.31** දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන අගය රු. |
|---|---|---|---|---|
| මෝටර් වාහන | 75,694,306 | 18,214,596 | | 93,908,902 |
| යන්ත්‍ර,මෙවලම් හා උපකරණ | 232,485,472 | 22,940 | | 232,508,412 |
| රසායනාගාර උපකරණ | 24,644,826 | 23,249,174 | (86,200) | 47,807,800 |
| ලීබඩු,සවිකිරීම් හා කාර්‍යාල උපකරණ | 10,346,645 | 3,366,258 | | 13,712,903 |
| පරිගණක හා උපාංග | 5,748,187 | 1,459,584 | | 7,207,771 |
| විද්‍යාත්මක උපකරණ | 2,633,671 | 28,423,316 | | 31,056,987 |
| භූ විද්‍යා සිතියම් | 370,000 | 1,136,753 | | 1,506,753 |
| ;ාවකාලික ගොඩනැගිලි | 2,266,754 | | (2,266,754) | |
| පුස්ථකාල පොත් | 966,734 | (966,734) | | |
| ඉඩම් | 714,274 | 8,600 | (9,360) | 713,514 |
| ගොඩනැගිලි | 882,056 | | (882,056) | |
| ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් | 5,570,415 | 2,107,089 | (4,031,072) | 3,646,432 |
| යන්ත්‍ර හා වාහන වැඩි දියුණු කිරීම් | 58,212,978 | 5,279,839 | (50,301,530) | 13,191,287 |
| පරිගණක වැඩි දියුණු කිරීම් | 266,426 | 8,303,107 | (163,448) | 8,406,085 |
| **එකතුව** | **420,802,743** | **91,571,256** | **(58,707,15** | **453,666,846** |

| ක්ෂයවීම් | 2010.12.31 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන අගය රු. | වර්ෂයේ ක්ෂයකිරීම් රු. | ඉවත් කිරීම් / ගැලපීම් රු. | 2011.12.31 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන අගය රු. |
|---|---|---|---|---|
| මෝටර් වාහන | 64, 943,664 | 6,274,131 | (212,500) | 93,908,902 |
| යන්ත්‍ර,මෙවලම් හා උපකරණ | 218,322,683 | 18,754,464 | | 237,077,147 |
| රසායනාගාර උපකරණ | 16,185,921 | 3,237,084 | (86,200) | 19,405,765 |
| ලීබඩු,සවිකිරීම් හා කාර්‍යාල උපකරණ | 7,393,018 | 394,264 | | 7,785,281 |
| පරිගණක හා උපාංග | 4,138,897 | 494,271 | | 4,633,167 |
| විද්‍යාත්මක උපකරණ | 2,623,469 | 2,550 | | 2,626,019 |
| භූ විද්‍යා සිතියම් | | 74,000 | | 74,000 |
| ;ාවකාලික ගොඩනැගිලි | 2,266,749 | | (2,266,749) | - |
| පුස්ථකාල පොත් | 917,044 | | (917,044) | - |
| ගොඩනැගිලි | 882,052 | | (882,052) | - |
| ගොඩනැගිලි වැඩ දියුණු කිරීම් | 2,670,008 | | (2,607,008) | - |
| යන්ත්‍ර හා වාහන වැඩ දියුණු කිරීම් | 36,269,357 | | (36,269, 357) | - |
| පරිගණක වැඩ දියුණු කිරීම් | 109,722 | | (109,722) | - |
| **එකතුව** | **356,720,384** | **29,230,764** | **(43,344,672)** | **342,606,474** |
| ශුද්ධ පොත් අගය | **64,082,359** | | | **111,060,372** |

ජල සම්පත් මණ්ඩලය නීත්‍යානුකූල හිමිකාරත්වයක් නොමැතිව ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ 2011.12.31 දිනට විස්තර පහත දැක්වේ.

| **පිහිටීම** | **ගොඩනැගිලි (ආසන්න වශයෙන්)** |
|---|---|
| ප්‍රධාන කාර්‍යාලය | 8477 වර්ග අඩි |
| රත්මලාන වැඩ බිම | 32960 වර්ග අඩි |
| අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානය | 11506 වර්ග අඩි |
| අනුරාධපුර සංචාරක නිවස | 3038 වර්ග අඩි |
| මොනරාගල ප්‍රාදේශීය කාර්‍යාලය | 1805 වර්ග අඩි |
| හම්බන්තොට ප්‍රාදේශීය කාර්‍යාලය | 1474 වර්ග අඩි |
| යාපනය ප්‍රාදේශීය කාර්‍යාලය | 1815 වර්ග අඩි |
| වව්නියා වැඩබිම | 1082 වර්ග අඩි |

සටහන් අංක **: 08**

<u>තොග</u>

| | **2011** | **2010** |
|---|---|---|
| | රු. | රු. |
| <u>ද්‍රව්‍යයන් හා අමතර කොටස්</u> | | |
| වාහන අමතර කොටස් | 1,150,590 | 709,089 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 299,198 | 448,370 |
| ගබඩා ද්‍රව්‍යයන් | 15,974,780 | 8,161,533 |
| ගොඩනැගිලි හා කාර්යාලය නඩත්තු ද්‍රව්‍ය | 393,530 | 386,509 |
| ලිපිද්‍රව්‍ය | 307,388 | 193,592 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් | 6,518,452 | 6,910,794 |
| කාර්යාල උපකරණ නඩත්තු අංශය | 76,822 | 94,595 |
| රසායනාගාර ද්‍රව්‍ය | 1,880,573 | - |
| | **26,601,333** | **16,904,483** |
| <u>ද්‍රව්‍යයන් හා අමතර කොටස් - කොළඹ මීගමුව ව්‍යාපෘතිය</u> | | |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 312,792 | - |
| ගබඩා ද්‍රව්‍යයන් | 2,424,417 | - |
| | **2,737,209** | **-** |
| **එකතුව** | **29,338,542** | **-** |

සටහන් අංක **: 09**

<u>වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ</u>

| | **2011** | **2010** |
|---|---|---|
| **සේවක** | | |
| (01) පොත් අත්තිකාරම් | - | 330,000 |
| (02) ආපදා ණය | 7,185,372 | 5,496,114 |
| (03) උත්සව අත්තිකාරම් | 212,000 | 232,500 |
| (04) ගමන් වියදම් අත්තිකාරම් | 47,051 | 120,063 |
| (05) පාපැදි ණය | 32,724 | 98,009 |
| (06) සේවක ණයගැතියන් | 204,912 | 164,907 |
| **උප එකතුව** | **7,682,059** | **6,441,592** |
| **වෙනත්** | | |
| (07) වෙළඳ ණයගැතියන් | 1,826,269 | 5,385,339 |
| (08) තැන්පතු | 60,155 | 160,155 |
| (09) සැපයුම්කරුවන්ට අත්තිකාරම් | 140,847 | 100,648 |
| (10) රඳවාගැනීමේ මුදල් | 2,130,712 | 900,224 |

| | | | |
|---|---|---|---|
| (11) | ලැබිය යුතු රඳවාගත් බදු | 1,461,870 | 1,443,510 |
| (12) | බැංකු ඇප බැඳුම්කර | 53,579 | 468,779 |
| (13) | වේලි සංරක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබිය යුතු | 740,878 | - |
| | **උප එකතුව** | **6,414,310** | **8,458,654** |
| **ලැබිය යුතු ගිණුම්වල මුළු එකතුව** | | **14,096,369** | **14,900,247** |
| (14) | අඩුකලා: ගෙවිය යුතු එකතුකල අගය මත බදු - රඳවා ගැනීම් මුදල් | (9,643) | (7,467) |
| (15) | අඩුකලා: ගෙවිය යුතු එකතුකල අගය මත බදු | (338,332) | (537,120) |
| | **එකතුව** | **13,748,394** | **14,355,660** |

සටහන් අංක **:10**

| <u>කලට පෙර ගෙවීම්</u> | **2011**<br>රු. | **2010**<br>රු. |
|---|---|---|
| සේවක රක්ෂණ | 8,313 | 8,398 |
| පුවත් පත් හා වාර සඟරා | 19,960 | 30,140 |
| කාර්යාල උපකරණ නඩත්තුව | - | 1,551 |
| පුත්තලම නගර සභාව - වරිපනම් බදු | 15,508 | - |
| **එකතුව** | **43,781** | **40,089** |

සටහන් අංක : 11

**මුදල් හා මුදල් සමාන දෑ**

| | | | |
|---|---|---|---|
| 1. | ලංකා බැංකුව යෝර්ක් වීදිය (ගි.අ.:0002026295) | 55,751 | 2,227,807 |
| 2. | ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව (ගි.අ.:0002322267) | 2,559,483 | 844,787 |
| 3. | ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව (ගි.අ.:0002322268) | 50,850 | 34,325 |
| 4. | ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව (ගි.අ.:0005342839) | 349,334 | 258,907 |
| 5. | ලංකා බැංකුව යාපනය ශාඛාව (19860) | - | 7,096 |
| 6. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බම්බලපිටිය ශාඛාව | 10,938,400 | 22,530,905 |
| 7. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බොරැල්ල ශාඛාව | 10,205 | 3,500 |
| 8. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බොරැල්ල ශාඛාව | 1,427 | 1,000 |
| | **එකතුව** | **14,466,450** | **25,908,329** |

සටහන් අංක **:12**

**විලම්භිත වගකීම්**
**ශේෂපත්‍රය අනුව හඳුනාගත් ශේෂයන් පහත දැක්වේ.**

| | **2011**<br>රු. | **2010**<br>රු. |
|---|---|---|
| **වර්ෂය මුල ශේෂය** | 58,544,345 | 61,764,957 |
| එකතුකලා:- ජ,නල් වවුචර් 40 මගින් මාරකිරීම් | 25,740 | - |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 7,025,383 | 310,143 |
| පාරිතෝෂික දායක මුදල් ගෙවීම | (2,627,146) | (3,530,755) |
| **වර්ෂය අග ශේෂය** | **62,968,322** | **58,544,345** |

සටහන් අංක : **13**

| ගෙවිය යුතු දෑ (ජංගම නොවන වගකීම්) | **2011** රු. | **2010** රු. |
|---|---|---|
| බලශක්ති සංරක්ෂණ අරමුදල | - | 240,000 |
| **එකතුව** | - | **240,000** |

සටහන් අංක **:14**
ගෙවිය යුතු දෑ (ජංගම වගකීම්)

| | | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| (1) | **සේවක මණ්ඩලය** | | |
| | 1:1 සේවක ණයහිමියෝ | 10,404 | 10,404 |
| | 1:2 සේවක පුහුණුවීම් භාණ්ඩාගාර ප්‍රතිපාදන | 9,236 | - |
| | 1:3 නොගෙවූ වැටුප් | - | 13,664 |
| | 1:4 භාණ්ඩාගාර ප්‍රතිපාදන | 8,667 | - |
| | 1:5 භාණ්ඩාගාර ප්‍රතිපාදන | 16,620 | - |
| | **උප එකතුව (1:1 සිට 1:5)** | **44,927** | **24,068** |
| (2) | **සේවා අත්තිකාරම්** | 12,774,194 | 15,903,603 |
| (3) | **වෙනත්** | | |
| | 3:1 විගණන ගාස්තු වෙන්කිරීම් | 368,929 | 218,929 |
| | 3:2 වෙනත් ණයහිමියෝ | 5,835,847 | 1,296,330 |
| | **උප එකතුව (3:1 සිට 3:2)** | **6,204,776** | **1,515,259** |
| (4) | රඳවාගැනීමේ මුදල් | 119,000 | 18,811 |
| (5) | සේ.අ.අ 10% | 986 | - |
| | උප එකතුව | **119,986** | **18,811** |
| (6) | අඩුකලා: ලැබිය යුතු භාණ්ඩ හා සේවා බදු | (6,418) | - |
| (7) | අඩුකලා: ලැබිය යුතු එකතුකල අගය මත බදු | (386,479) | (128,319) |
| | | **18,750,986** | **17,333,422** |

**ගිණුම් සඳහා වූ සටහන්**
සටහන් අංක **: 15**

| **උපචිත වියදම්** | **2011** රු. | **2010** රු. |
|---|---|---|
| වැටුප් හා වේතන | 294,564 | 181,837 |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 540,250 | 511,775 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 704,472 | 392,201 |
| දුරකතන බිල් | 99,624 | 57,828 |
| ඉන්ධන | 40,803 | 204,199 |
| මෝටර් වාහනනඩත්තු | 109,973 | 74,655 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු | 171,128 | - |
| ලිපිද්‍රව්‍ය | 34,015 | 1,380 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 43,220 | 21,133 |
| උපදේශක ගාස්තු | 4,590 | 3,090 |
| විදුලි බිල් | 129,012 | 87,849 |
| ගොඩනැගිලි කුලි | 51,000 | 15,000 |
| කොරකහවැව වියදම් | 2,150 | - |
| විදුම් වැඩබිම් පරිභෝජන ද්‍රව්‍ය | 1,278,097 | 140,750 |

| | | |
|---|---|---|
| භූගත ජල වෙනත් වියදම් | 535 | 2,166 |
| බැංකු ගාස්තු | - | 2,250 |
| ජල බිල් | 14,238 | 6,839 |
| සංග්‍රහ වියදම් | 1,790 | 3,875 |
| පුවත් පත් | 2,330 | 5,360 |
| සේ. අ. අ. 10% | 427,958 | 398,081 |
| සේ. අ. අ. 12% | 513,550 | 489,369 |
| සේ. නි. භා. අ. 3% | 128,387 | 122,342 |
| විවිධ වියදම් | 6,387 | 10,893 |
| වෛද්‍යාධාර | 43,200 | 1,500 |
| මුද්දර ගාස්තු | 9,700 | 8,550 |
| කාර්යාල ගොඩනැගිලි නඩත්තු | - | 500 |
| එකතුකල අගය මත බදු මුදල් | 174,200 | 60,807 |
| එකතුකල අගය මත බදු මුදල් | 1,522,770 | 961,285 |
| ආර්ථික සේවා ගාස්තු | - | 130,469 |
| ටෙන්ඩර් බැඳුම්කර හා ආපසු ගෙවන තැන්පතු | - | 5,000 |
| පරිගණක හා උපාංග | - | 7,379 |
| පාරිතෝෂික | - | 261,013 |
| සේවක රක්ෂණ | - | 7,205 |
| රසායනාගාර උපකරණ | 14,000 | 89,700 |
| රසායනාගාර නඩත්තුව | 76,896 | 9,232 |
| කම්කරු ගාස්ත | - | 16,100 |
| ප්‍රචාරණය | 14,337 | 3,000 |
| වාහන සේවා කිරීම් - රත්මලාන | - | 190,000 |
| සුභසාධක වියදම් | 8,000 | 32,000 |
| ගමන් වියදම් අත්තිකාරම් | 3,000 | 3,000 |
| අධ්‍යක්ෂක දීමනා | 64,680 | - |
| නීති වියදම් | 29,800 | - |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 1,500 | - |
| උපයන විට බදු | 2,045 | - |
| සේවා අත්තිකාරම් | 3,037 | - |
| **එකතුව** | **6,565,238** | **4,519,612** |

සටහන් අංක **: 16**

<u>ආරක්ෂක තැන්පත්</u>

| | | මූලික තැන්පතුව | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|---|
| ( 1 ) ඩබ්.පී.එස්. ගුණතිලක මයා | - අයකැමි | 3,500 | 10,205 | 3,500 |
| ( 2 ) විමල් අමරසිංහ මයා | - ගබඩා භාරකරු | 500 | 1,407 | 500 |
| ( 3 ) කේ. ඒ. විමල් මයා | - ගබඩා භාරකරු | 5,000 | 5,000 | 5,000 |
| ( 4 ) එන් වික්‍රමසිංහ මයා | - ආපනශාලා | - | - | 500 |
| **එකතුව** | | **9,000** | **16,631** | **9500** |

සටහන් අංක **: 17**

**පිටු අංක 03 හි ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය දක්වා ඇත.**

**ජල සම්පත් මණ්ඩලය**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No } LP/E/2012/13

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Dat } 2013 ජනවාරි 18 දින

සභාපති,
ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

සමාංක හා 2012 නොවැම්බර් 15 දිනැති මාගේ ලිපියට යොමුවේ.

02 ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

අත්සන් කළේ,
එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

**ජල සම්පත් මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ජල සම්පත් මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2012 ජූලි 13 දින නිකුත් කරන ලදී.

## 1..2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හෝ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණනයේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණනයේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිතවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතතාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2. 2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වා ගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැකවීම

**2.2.1 ශ්‍රී ලංකා ගිණම්කරණ පමිති**

රුː 262,515,402 ක් වටිනා දේපළ, පිරියත හ උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ පමිති අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව 2011 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා වූ මුළු ප්‍රතිපාදනය රුː 62,942,582 ක් වූවත්, මූල්‍ය ප්‍රකාශනවල රුː 62,968,322 ක මුදලක් පෙන්නුම් කෙරුණු බැවින් රුː 25,740 ක වෙනසක් දැක්වේ.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට තොග අගය රුː 26,601,330 ක් වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ භෞතික පරික්ෂණ වාර්තා අනුව එය රුː 26,541,791 ක් වූයෙන් රුː 59,539 ක වෙනසක් දැක්වේ.

(ඇ) ප්‍රධාන වර්ගීකරණ 09 යටතට ගැනෙන ඉන්වෙන්ට්‍රි අයිතම 8,078 ක් අමතර කොටස් හා ලිපි ද්‍රව්‍ය අගය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණි.

(ඈ) රුː 1,345,717 ක් වටිනා පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනික කර නොතිබුණි.

(ඉ) නීත්‍යානුකූල අයිතිය නොමැතිවීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල පරිශ්‍රවල ඉඩම් අටක් හා ගොඩනැගිලි, රත්මලාන කර්මාන්ත ශාලාව, අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානය, අනුරාධපුර සංචාරක බංගලාව සහ මොණරාගල, හම්බන්තොට, යාපනය සහ වවුනියාව වැඩබිම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණි.

(ඊ) රුː 5,523,346 ක් වටිනා මෝටර් රථ 5 ක නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට හා මණ්ඩලයේ වත්කම් ලෙස ශේෂ පත්‍රයේ පෙන්නුම් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2011 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු රුː 1,826,269 ක ඇතුළත් වූ රුː 645,766 ක මුදලක් වසර 2 කට වඩා හිඟව පැවතියද, අයකර ගැනීමට මණ්ඩලය ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව මොණරාගල රෝහලින් රුː 1,072,239 ක මුදලක ලැබිය යුතු වුවත් රෝහල තහවුරු කර තිබුණේ රුː 761,808 ක මදලක් පමණි.

(ඇ) ආයතන 27 කින් හා පුද්ගලයින්ගෙන් එකතුව රුː 5,890,091 ක සේවා අත්තිකාරම් ලබාගෙන තිබුනත්, වසරකට වඩා ඉකුත්වීමෙන් පසුවත් අදාළ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් ගිණුම්වල වූ පහත විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| ගිණුම් විස්තරය | වටිනාකම<br>රු: | ලබාගත නොහැකි වූ සාක්ෂි |
|---|---|---|
| (I) වෙළෙඳ ණයගැතියෝ | 754,030 | සනාථ කිරීම් |
| (II) ණයහිමියෝ | 11,312,594 | සනාථ කිරීම් |
| (III) වාහන | 93,908,902 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (IV) නොනිමි වැඩ | 46,167,438 | විස්තරාත්මක උප ලේඛණ |
| එකතුව | 152,142,964 | |

**2..2.5 නීති, රීතී රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

විගණනයේදි නිරීක්ෂණය වූ අනුකූල නොවීම්. අවස්ථා පහත දැක්වේ.

| නීති, රීතී සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 14 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල උපදේශක කමිටුවක් ක්‍රියාත්මකව නොතිබුණි. |
| **(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ චක්‍ර ලේඛය | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛණයක් මණ්ඩලය විසින් පවත්වා නොතිබුණි |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරණ චක්‍ර ලේඛය | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර පරිගණක හා පරිගණක උපාංග විස්තර වාර්තා කිරීමට ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (iii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍ර ලේඛය<br>*4. 2. 5 ඡේදය | පැරණි සෙමින් චලනය වන හා යල්පැනගිය තොග හඳුනාගත හැකි ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) 1990 ඔක්තෝම්බර්10 දිනැති අංක 41/90 චක්‍රලේඛයේ 2.1 ඡේදය | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර මණ්ඩලයේ වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) 2002 පෙබරවාරි 26 දිනැති අංක 01/2002 දරණ චක්‍රලේඛ ලිපිය | මණ්ඩලයේ වාහනවල රාජ්‍ය ලාංඡනය හා නම පින්තාරු කර නොතිබුණි. |

2.2.6 පරිබාහිර ගණුදෙණු

විධිමත් අනුමැතියකින් තොරව මණ්ඩලයේ සේවකයින් විසින් පුත්තලම, අනුරාධපුරය, කිලිනොච්චිය, යාපනය සහ නාගදීපයට විනෝද චාරිකාවක් සඳහා යාමට පාවිච්චි කර තිබුනු බස් රථ 03 ක සඳහා මණ්ඩලය විසින් 2011 දෙසැම්බර් මාසයේදී රුඃ 178,000 ක කුලී ගාස්තු ගෙවා තිබුණි.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මණ්ඩලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රුඃ 11,195,727 ක ඌණතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රුඃ 7,134,891 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලවල රුඃ 18,330,618 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ. වියදම් රුඃ 43,006,618 කින් වැඩිවී තිබීම මූල්‍ය ප්‍රතිඵල පිරිහීමට පධාන හේතුව විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

වාර්ෂික ඇස්තමේන්තුවට හා විගණනයට ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

(අ) මූල්‍ය කාර්ය සාධනය

ආදායම

| විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තත්‍ය ආදායම | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රුඃ | රුඃ | රුඃ | % |
| ජල භූ විද්‍යා විමර්ශන | 7,500,000 | 4.616.928 | (2,883,072) | (38) |
| නල ළිං ඉදිකිරීම් | 3,000.000 | 43,155.836 | 13,155,836 | 44 |
| අත් පොම්ප සවිකිරීම් | 2,500,000 | 3,945,607 | 1,445,607 | 58 |
| පොම්ප කිරීමේ පරීක්ෂණ | 2,000,000 | 2,737,943 | 737,943 | 37 |
| නල ළිං පිරිසිදු කිරීම් | 1,800,000 | 2,521,993 | 721,993 | 40 |
| ජල සාම්පල විශ්ලේෂණ | 500,000 | 1,835,378 | 1,335,378 | 267 |
| පුත්තලම ජලධරවල සමස්ථානික අධ්‍යයනය | 100,000 | 33,380 | (66,620) | (67) |
| කොළඹ සිට මීගමුව දක්වා ජල භූ විද්‍යා වෙරළ අධ්‍යයනය | 20,000,000 | 7,366,539 | (12,633,461) | (63) |
| අනුරාධපුර ජලධර ක්‍රමයේ ජල ගුණත්ව වෙනස්වීම් අධ්‍යයනය | 2,000,000 | 1,149,990 | (850,010) | (43) |
| සිතියම් සංග්‍රහය | 200,000 | 21,333 | (178,667) | (89) |
| සුළං මෝල් | 250,000 | 110,440 | (139,560) | (56) |

| | | | | |
|---|---|---|---|---|
| භූගෝලීය තොරතුරු පද්ධති ආදායම් | 50,000 | 7,000 | (43,000) | (86) |
| පිරිපහදු යන්ත්‍රෝපකරණ සහ ජල | | | | |
| දූෂණ පාලනය | - | 338,826 | 338,826 | 00 |
| භූගත ජල සංවර්ධනය | - | 14,118,464 | 14,118,464 | 00 |
| (MANRIP-JICA) | | | | |
| කාර්ය මණ්ඩල රක්ෂණ | 50,000 | - | 50,000 | 100 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 20,000 | 27,360 | (7,360) | (37) |
| නීතී වියදම් | 150,000 | 277,274 | (127,274) | (85) |
| මුද්දර බඳු | 1,000 | 4,500 | (3,500) | (350) |
| පුහුණු මධ්‍යසථානය වියදම් | | | | |
| අනුරාධපුරය | 1,000,000 | 111,017 | 888,983 | 89 |
| කුලී ගාස්තු | - | 132,516 | (132,516) | 00 |

(ආ) භෞතික කාර්ය සාධනය

| විෂය | ඇස්තමේන්තු ඒකක ඒකක | නිම කරන ලද ඒකක | විචලනය |
|---|---|---|---|
| **උත්පාදනය කළ අරමුදල් ව්‍යාපෘතිය** | | | |
| ජල භූ විද්‍යා විමර්ශන | 50 | 145 | 95 |
| නල ළිං ඉදිකිරීම් | 50 | 74 | 24 |
| අත් පොම්ප සවිකිරීම් | 75 | 52 | 23 |
| පොම්ප කිරීමේ පරීක්ෂණ | 40 | 40 | - |
| නල ළිං පිරිසිදු කිරීම | 40 | 57 | 17 |
| ජල සාම්පල විශ්ලේෂණ | 500 | 3206 | 2706 |
| **ඒකාබද්ධ අරමුදල් ව්‍යාපෘතිය** | | | |
| ජල භූ විද්‍යා විමර්ශන | 150 | 43 | 107 |
| නල ළිං ඉදිකිරීම | 150 | 11 | 139 |
| පොම්ප කිරීමේ පරීක්ෂණ | 50 | - | 50 |
| ජල සාම්පල විශ්ලේෂණ | 150 | 200 | 50 |

**වියදම**

| විෂයය | ඇස්තමේන්තගත වියදම | තත්‍ය වියදම | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු: | රු | රු: | % |
| අධ්‍යක්ෂ ගාස්තු | 200,000 | 404,227 | (204,227) | (102) |
| පාරිතෝෂික | 4,000,000 | 6,966,77 | (2,966,770) | (74) |
| වෙනත් දීමනා | 25,0000 | 32,750 | (7,750) | (31) |
| ගමන් වියදම් - විදේශීය | 150,000 | - | 150,000 | 100 |
| සිදුරු කිරීමේ වැඩ පරිභෝජන ද්‍රව්‍ය | 20,000,000 | 34,503,522 | (14,503,522) | (73) |

| | | | | |
|---|---|---|---|---|
| රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය | 1,000,000 | 3,150,692 | (2,150,692) | (215) |
| අනෙකුත් පාරිභෝජන ද්‍රව්‍ය | 200,000 | 372,540 | (172,540) | (86) |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ | 300,000 | 18,150 | 281,850 | 94 |
| ජල බිල්පත් | 100,000 | 73,706 | 26,294 | 26 |
| විවිධ වියදම් | 400,000 | 298,405 | 101,595 | 25 |
| **නඩත්තු හා අළුත්වැඩියා** | | | | |
| සේවා - මෝටර් වාහන | 3,800,000 | 5,304,848 | (1,504,848) | (40) |
| - කාර්යාල උපකරණ | 400,000 | 737,287 | (337,287) | (84) |
| - ගොඩනැගිලි | 300,000 | 995,417 | (695,417) | (232) |
| සුබසාධන හා ක්‍රීඩා පහසුකම් | 150,000 | 294,106 | (144,106) | (96) |
| විනෝද | 80,000 | 190,531 | (110,531) | (138) |
| විවේක නිවාඩු ප්‍රතිපූරණ | 40,000 | 9,440 | 30.560 | 76 |
| නිල ඇඳුම් | 250,000 | 347,908 | (97,908) | (39) |
| ප්‍රචාරණ හා දැන්වීම් වියදම් | 300.000 | 472,391 | 172,391) | (57) |

| | | | |
|---|---|---|---|
| ළිං අධීක්ෂණය | 100 | 250 | 100 |
| මට්ටම් කිරීම | 150 | - | 150 |
| සාම්පල ස්ථාන සමග මෙහෙයුම්ජාලගත පිහිටුවීම | 400 | 150 | 250 |
| ජල සාම්පල විශ්ලේෂණ රැස් කිරීම | 500 | 400 | 100 |

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය තුල පිරිපහදු යන්ත්‍රෝපකරණ, ජල දූෂණ පාලන සහ භූගත ජල සංවර්ධනය මඟින් රුඃ 14,457,293 ක ආදායමෙ. උපයා තිබුනත්, මෙම කටයුතු වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල ජල භූ විද්‍යා විමර්ශණ, නල ළිං ඉදිකිරීම්, අත් පොම්ප සවිකිරීම්, පොම්ප කිරීමේ පරීක්ෂණ, නල ළිං පිරිසිදුකිරීම හා ජල සාම්පල විශ්ලේෂණ වලින් මණ්ඩලය රුඃ 58,813,685 ක ආදායමක් උපයා තිබුනත්, එකිනෙක හා සියලු කාර්යයන් සඳහා විස්තරාත්මක ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදි හෙළිදරව් විය. තත්‍ය පිරිවැය තත්‍ය ආදායම සමඟ සැසඳීමට හැකිවන සේ එකිනෙක කාර්යයෙහි තත්‍ය පිරිවැය වාර්තා කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iii) මණ්ඩලය පොම්ප කිරීමේ පරීක්ෂණ 50 ක් හා මට්ටම් කිරීම් 150 ක් සිදු කිරීමට ඇස්තමේන්තු කර තිබුනත් සමාලොචිත වර්ෂය තුල ඒවායින් කිසිවක් ඉටුකර නොතිබුණි.

(iv) රුඃ 150,000 ක විදේශ ගමන් වියදම් ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර, රුඃ 132,516 ක කුලී ගාස්තු සඳහා අයවැය ලේඛණයෙහි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද රුඃ 1,689,960 ක ලැබිය යුතු මුදල් ඒවා අයකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් පසුගිය වර්ෂය තුල කපාහැර තිබුණි.

(ආ) මණ්ඩලයේ විදුලි යන්ත්‍ර 5 ක අක්‍රිය වී තිබූ පැය මීටර අළුත්වැඩියා කිරීමට ඵලදායී ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. එමනිසා ඉන්ධන සඳහා දරන ලද වියදම් සතුටුදායක ලෙස විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඇ) විසර්ජන පනතේ ප්‍රාග්ධන වියදම් සඳහා රුː 60,000,000 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුනද, සමාලෝචිත වර්ෂය තුල රුː 17,070,000 ක මුදලක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. මුළු ප්‍රතිපාදනයෙන් රුː 42,930,000 ක මුදලක් හෙවත් 72% ක් මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධිත පනතේ 12 වගන්තියේ සඳහන් පහත දැක්වෙන කරුණු සම්බන්ධව මණ්ඩලය අර්ථාන්විත ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(i) රටේ ජල සම්පත් (සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව) පාලනය කිරීම විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම.

(ii) ගංගා ඇළ මාර්ග හා වෙනත් ජල මාර්ග අපවිත්‍රවීම වැළැක්වීම.

(iii) පහත සඳහන් අරමුණු වලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

* ජල සම්පත් බහු කාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම.
* ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ජල සම්පත් ලබාදීම.
* ලවණතාව පාලනය කිරීම

(iv) රටේ භූ ගත ජල සම්පත් සංරක්ෂණය, උපයෝගීකරණය පාලනය හා සංවර්ධනය සඳහා සවිස්තරාත්මක හා එකිනෙක සම්බන්ධ සැළසුම් සකස් කිරීම.

(v) ජල භූ විද්‍යාව සම්බන්ධ මූලික දත්ත සමීක්ෂණ සහ අනෙකුත් පරීක්ෂණ වලට අනුව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරකම්වල සම්බන්ධීකරණයක් ඇති කිරීම.

(vi) රටේ භූ ගත ජල සම්පත් සම්බන්ධයෙන් රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා මඟින් සිද කරනු ලබන ප්‍රයේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැළසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

(vii) රටේ භූ ගත ජල සම්පත් සංරක්ෂණයට, උපයෝගීකරණයට සහ සංවර්ධනයට අදාළව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වා ගැනීමේ හැකියාව, ඵලප්‍රයෝජන සහ ආර්ථික ශක්‍යතාව තක්සේරු කිරීම.

### 4. 3 සේවක පාරිතෝෂික අරමුදල

පාරිතෝෂික ගෙවීම් සඳහා 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ගිණුම්වල රුː 62,909,709 ක මුදලක් වෙන්කර තිබුනද, ඉදිරියේදී ඇතිවන පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් ආයෝජන මුදලින් රුː 10,938,400 ක මුදලක් පමණක් ඉතිරිව තිබුණි. අනාගතයේදී පාරිතෝෂික ගෙවීම් සඳහා පවත්වා තිබුණ ඉහත සඳහන් ඉතිරි කිරීමේ ගිණුමෙන් මණ්ඩලයේ එදිනෙදා වියදම් සඳහා රුː 14,740,000 ක මුදලක් වර්ෂය තුළ ආපසු ලබාගෙන ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5. 1 අයවැය පාලනය

මණ්ඩලයේ අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව පෙන්නුම් කෙරේ.

5 .2 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>

මුදල් පනතේ 14 (3) වගන්තිය ප්‍රකාර 2008, 2009 හා 2010 වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කළ මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

(ආ) අයවැය

(ඇ) ණයගැතියෝ හා ණයහිමියෝ

(ඈ) නීතී රීතී හා රෙගුලාසි වලට අනුකූල වීම

(ඉ) සැළසුම්කළ කා්රයයන් ඉටුකර ගැනීම

**අත්සන් කළේ,**

**එච්.ඒ.එස්.සමරවීර**

**විගණකාධිපතී**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் வள முகாமைத்துவ அமைச்சு
MINISTRY OF IRRIGATION & WATER RESOURCES MANAGEMENT

ජල සම්පත් මණ්ඩලය
நீர் வளச் சபை
WATER RESOURCES BOARD

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | ඩබ්.ලිව්.ආර්බී/අයිඒ/32 | | |
| දිනය / திகதி / Date | | | |
| ඔබේ අංකය / உமது இல / Your ref | 2012. 08. 30. | | |

නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>ජල සම්පත් මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ ලිපි අංක එල්පී/ඊ/2012/13 හා 2012. 07. 30 දිනැති ලිපිය හා බැඳේ.
මාගේ නිරීක්ෂණ ඔබගේ කාරුණික අවධානය සඳහා පහත දැක්වේ.

**2.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>**

අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගෙන ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට බලාපොරොත්තු වේ.

**2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) විගණන සඳහා ඉදිරිපත් කරන ලද උප ලේඛණයේ පාරිතෝෂික වෙන්කිරීම් සඳහා රුː 25,740.00 ක් ඇතුලත්ව නොතිබුණි. නමුත් ආයතනයේ උප ලේඛණයේ එය ඇතුලත් වී තිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොග සමීක්ෂණ වා්රතාවල අයිතම කීපයක වටිනාකම් සඳහන් කර නොතිබීම නිසා වෙනසක් නිර්මාණය වී තිබේ.

කෙසේ වෙතත් නියමිත පරිදි ආයතනයේ තොග සමීක්ෂණ වාර්තාවල සඳහන් කර ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රමාද දෝෂයක් වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) බොහෝ අයිතම ප්‍රමාණයක් ආධාර වශයෙන් ලැබීම හේතුවෙන් වටිනාකම සඳහන් වීමක් සිදුවී නොමැත. සමහර අයිතමයන් පාවිච්චි කර නැවත ගබඩාවට ලැබී තිබූ භාණ්ඩ විය.

අනෙක් අයිතමයන් කාලයක සිට අගය වීමක් සිදුවී නොමැත. ඉදිරියේදී මේවායේ අගය ඇස්තමේන්තු කර පොත්වල සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

සභාපති / தலைவர் / Chairman — Tel : 011 2696910, Fax : 011 2696894
ක්‍රියාකාරී අධ්‍යක්ෂ / தொழிற்படு பணிப்பாளர் / Working Director — Tel / Fax : 011 2696429
සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager — Tel / Fax : 011 2689772
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office — Tel : 011 2697050, 011 2694835
Web Site : www.wrb.gov.lk E-mail : wrbmiwm@sltnet.lk/wrbcmb@sltnet.lk
2 ඒ. හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07. 2ஏ,ஹெக்டர் கொப்பேகடுவ மாவத்தை, கொழும்பு 07. 2A, Hector Kobbekaduwa Avenue, Colombo 07.

(ඈ) භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන වශයෙන් ලැබුනු මුදලින් ප්‍රාග්ධන වියදම් සඳහා වියදම් කරන ලද රු: 1,345,717.00 ක් ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඉ) අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ හා මොණරාගල කාර්යාලයේ නීත්‍යානුකූල ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. (ඉඩම් සඳහා ඇස්තමේන්තුගත මුදල් දැනටමත් ගෙවා ඇත)

අනුරාධපුර සංචාරක නිවාසයේ හා හම්බන්තොට කාර්යාල සඳහා වන ඉඩම් වෙනුවෙන් මිණුම් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

රත්මලාන වැඩපල පිහිටි ඉඩම වෙනුවට විකල්ප ඉඩමක් ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දීමට නියමිතය. (දැනට සාකච්ඡා මට්ටමේ පවතී)

ප්‍රධාන කාර්යාලයේ හා වවුනියා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ඊ) වාහන අංක ජී--8568 දැනටමත් අගය කර ගිණුම්වල සටහන් කර ඇත.

ඨජ- 3331 වාහනයේ නීත්‍යානුකූල අයිතිය ලැබී නොමැති නිසා ගිණුම්වල සටහන් කර නැත.

ඨබ-1841, ඨබ -1778 හා 40-1844 යන වාහන යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්වල සටහන් වී ඇත.

2011 වසරේදී මිළදී ගන්නා ලද ශඹ-5859 වාහනය මෙම වසරේ ණීඑකතු කිරීම්‍ යටතේ ගිණුම් ගත කර ඇත.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) වව්නියා ප්‍රාදේශීය ලේකම් හිග ශේෂය ගෙවීම සඳහා එකග වී ඇත.

අවශ්‍ය තොරතුරුවල හිඟකම නිසා අදාල මුදල නිරවුල් කිරීමට නොහැකි බව ජල සම්පාදන මණ්ඩලය දැනුම් තිබේ.

ජාතික අධ්‍යාපන ආයතනයේ අදාල මුදල ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) රු: 267,040.93 මුදලකට 2011.12.31 දිනෙන් චෙක්පතක් 2012 ජනවාරි මාසයේදී ලැබුණි. දැනට හිඟ මුදල රු: 43,390.00 ක් පමණි. හිඟ මුදල ගෙවීම සඳහා මොණරාගල රෝහල එකඟ වී ඇත.

(ඇ) ආයතන දෙකක් ඉල්ලුම් කරන ලද මුදල නිදහස් කර ඇත. අනෙකුත් ආයතනද ඉතිරි මුදල් ඉල්ලුම් කල විට නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් කළමනාකරණයට හා තොග පාලනය සඳහා දැනටමත් ක්‍රියාත්මක කරනු ලබන මෘදුකාංග පද්ධතිය මගින් අවශ්‍ය තොරතුරු ලබාගැනිමට හැකියාව ඇත.

### 2.2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

(අ) මෙම උපදේශක කමිටුව ක්‍රියාත්මක වන්නේ පනතේ 12 වන වගන්තියේ සඳහන් සියලුම කරුණු ගැන හෝ යම් කරුණක් ගැන මණ්ඩලයට උපදෙස් ලබාදීම සඳහාය. මෙම කමිටුව රජයේ ආයතන 15 ප්‍රධානීන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. දැනටමත් මෙම කමිටුව ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය හා තොග පාලනය සඳහා මෘදුකාංගයක් ස්ථාපනය කර ඇත. දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) (II) - එම -

(III) - එම -

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ

(I) අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා සටහන් කර ගතිමි. මණ්ඩලයේ වාහන වල රාජ්‍ය ලාංඡනය සටහන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.6 පරිබාහිර ගණුදෙණු

මෙම චාරිකාවේ මූලික පරමාර්ථය වූයේ සේවක සුහසාධනය  මෙන්ම ඔවුනගේ දැනුම, ආකල්ප, කුශලතාව හා කාර්යක්ෂමතාව වැඩි දියුණු  කිරීම හා මණ්ඩලය විසින් වියළි කලාපය තුල ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳව අවබෝධයක් ලබාදීමයි.

## 03. මූල්‍ය සමාලෝචන

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

2010 වර්ෂයේ අග භාගයේ හා 2011 වසර තුලදී මණ්ඩලය විසින් ආධුනික විදුම් නිලධාරීන්, භූ විද්‍යාඥයින්, රියැදුරු හා කම්කරුවන් ලෙස සේවකයින් 44 දෙනෙක් සේවයට බඳවා ගැනිමට කටයුතු කරන ලදී. ඒ අනුව මණ්ඩලයට ඔවුන්ගේ වැටුප් හා අනෙකුත් වියදම් ගෙවීමට සිදුවිය. ඊට අමතරව ගතවූ වසර ගැන සැලකීමේදී ඉන්ධන, දුරකථන, විදුලිය හා ජල බිල් සඳහා වැඩි මුදලක් දැරීමටද සිදුවිය.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

:ස* සියලුම ක්‍රියාකාරකම් සඳහා අදාල සේවා යෝජකයින් වෙත ඇස්තමේන්තු සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සිදු කර ඇත. මණ්ඩලය විසින් අදාල ක්‍රියාකාරකම් භාර ගැනීම සිදු කරනු ඇත්තේ ඇස්තමේන්තු පිලිබඳව සේවා යෝජකයින්ගේ තහවුරුවක් ලබාගැනිමත් සමගයි.

:සස* මණ්ඩලය විසින් භාර ගන්නා ලද සියලුම කාර්යයන් සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තු හා පිරිවැය වාර්තා පිළියෙල කර ඇත.

:සසස* පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරිමේදී මූලික සොයා ගැනීම් සිදු කිරිමෙන් අනතුරුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් වෙනස් වේ. මෙම කරුණු යටතේ භූගත ජලය ඇගයීමේ ජාලය සැළසුම් කිරීම තහවුරු කිරීමේ අදියරේ පවතී. තහවුරු කිරීමේ අදියරෙන් පසුව පොම්ප පරීක්ෂණ හා මට්ටම් ලබා ගැනිම සිදු කිරීම කරනු ලැබේ

:සඩ* ප්‍රතිපාදන සිදුකර ඇත. විදේශ ගමන් වියදම් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ අවශ්‍යතාවයක් ඇති නොවුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වාහන තුනක් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර, ධාවනයට සුදුසු තත්වයේ අනෙක් වාහන දෙක අලුත්වැඩියා කරමින් පවතී.

(ආ) මෙම විදුම් යන්ත්‍රවල කොටස් අවශ්‍යතාවය අනුව අනෙක් විදුම් යන්ත්‍රවල අලුත්වැඩියාවන් සඳහා යොදාගෙන ඇත.

(ඇ) සමහර ලැබිය යුතු මුදල එකතු කර ගැනිමට නොහැකි නිසා පොත්වලින් ලියා හැරීමට කටයුතු කර ඇත.

(ඈ) අලුත්වැඩියා සඳහා ක්‍රියා මාර්ග ගනු ලැබුවත්, තාක්ෂණික දෝෂයන් නිසා අසාර්ථක වී ඇත.

(ඉ) භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති යටතේ නල ළිං 300 ක් ඉදිකිරීමට සැළසුම් කර තිබුණි. නමුත් පවත්නා විදුම් යන්ත්‍රවලින් (බොහොමයක් විදුම් යන්ත්‍ර වසර 30 ක් පැරණි නිසා) අපේක්ෂා කල ඉලක්කයට යාමට අපහසු විය. විදුම් යන්ත්‍ර නිතර නිතර අලුත්වැඩියා වලට භාජනය විය. අලුත් විදුම් යන්ත්‍ර ලබාගැනිම සඳහා මහා භාණ්ඩාගාරයට ඉල්ලුම් කලත්, මෙම තත්වය මග හරවා ගැනිමට මෙතෙක් සාර්ථක විසඳුමක් භාණ්ඩාගාරයෙන් නොලැබුණි. මණ්ඩලයට පරීක්ෂණ නල ළිං සියල්ල ඉදි කිරීමට හැකියාව තිබුණා නම් මෙම සම්පූර්ණ ප්‍රතිපාදනයම භාවිතයට ගැනීමට හැකියාව තිබුණි.

(ඊ) (i) රෙගුලාසි පිළියෙල කර වාරිමාර්ග ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට 2012 මාර්තු මාසයේදී ඉදිරිපත් කරන ලද අතර, අමාත්‍යාංශය ඒ සම්බන්ධව කටයුතු කරමින් සිටී.

(ii) - එම -

(iii) මෙම රෙගුලාසී බලාත්මක වන්නේ ගරු ඇමතිතුමා විසින් ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව වේ.

(iv) රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ බලතල නොමැතිව සැළසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීමට නොහැකිය. (අදාල සැළසම් ක්‍රියාත්මක කිරීම සිදු කල හැක්කේ ඉහත රෙගුලාසි බලාත්මක වීමෙන් පසුව වේ.)

(v) අවශ්‍යතාවය පරිදි භූ ජල විද්‍යාවට අදාල කාර්යයන් සම්බන්ධව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා සමග සම්බන්ධීකරණය වී කටයුතු කරනු ලැබේ.

(vi) ඔවුන්ගෙන් වාර්තා ලැබුනු ඕනෑම අවස්ථාවක ඒවා විශ්ලේෂණය කර ඇත.

(vii)ව්‍යාපෘති ශකත්‍ය වාර්තා තක්සේරු කිරීම සඳහා අවශ්‍ය පාරිසරික ඇගයීම් සිදු කිරීමට සම්බන්ධ වී ඇත.

### 4.3 සේවක පාරිතෝෂික අරමුදල

අරමුදල් ගිණුම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කෙරේ.

## 5. ගිණුම් කටයුතු හා යහ පාලනය

### 5.1 අයවැය පාලනය

භූගත ජලය පර්යේෂණ සම්බන්ධ පරීක්ෂණ නල ළිං ඉදි කිරීමේ කාර්යය පැරණි විදුම් යන්ත්‍ර වලින් ඉටුකර ගැනිමට සිදුවිය. යන්ත්‍රෝපකරණවල උපරිම උපයෝගීත්වය උපකල්පනය කරමින් මෙම කාර්යය සැළසුම් කරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමේදී මෙම පැරණි විදුම් යන්ත්‍ර නිතර නිතර අලුත්වැඩියාව සඳහා භාජනය වීම නිසා බලාපොරොත්තු වූ ඉලක්කය කරා ලගාවීම අපහසු විය. මෙහි ප්‍රතිඵලය ඇස්තමේන්තු හා සත්‍ය වියදම්වල වෙනසට හේතුවී ඇත. මණ්ඩලය මේ වන විටත් මෙම තත්වය භාණ්ඩාගාරයට දැනුම් දීමට හා 2013 වසරට නව විදුම් යන්ත්‍ර 03 ක් ලබාගැනිම සඳහා අවශ්‍ය ව්‍යපෘති යෝජනාවන් ජාතික සැළසුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. මණ්ඩලය විසින් ඉල්ලුම් කර ලද උපකරණ ලැබුනහොත් විචලයන් අවම කල හැකිවේ.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

වාර්ෂික වාර්තා සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර තිබේ.

## 6. පද්ධති හා පාලන

ඉහත සඳහන් ක්ෂෙත්‍රයන්හි යහපත් පාලනයක් ඇති කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර තිබේ.

අත්සන් කළේ,

බන්ධුල මුණසිංහ

සභාපති

ජල සම්පත් මණ්ඩලය